# 2017

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# வருடாந்த செயலாற்றுகை அறிக்கை

# Annual Perpormence Report



අභ්‍යන්තර කටයුතු,වයඹ සංවර්ධන හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

உள்ளக அலுவல்கள், வடமேல்
அபிவிருத்தி மற்றும் கலாச்சார
அலுவல்கள் அமைச்சு

Ministry of Internal Affairs,Vayamba
Development and Cultural Affairs

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

தேசிய நூதனசாலைகள் திணைக்களம்

DEPARTMENT OF NATIONAL MUSEUM

අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා

සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

# ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

# කාර්ය සාධන වාර්තාව - 2017

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

කොළඹ - 07

**ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව**

## <u>දැක්ම</u>

සෞභාග්‍යමත් අනාගතයක් උදෙසා ජාතික උරුමය සංරක්ෂණය, ප්‍රවර්ධනය සහ ප්‍රචාරණය කිරීම

## <u>මෙහෙවර</u>

සංස්කෘතික හා ස්වභාවික උරුමයට අයත් සම්පත් විද්‍යාත්මකව හා ක්‍රමානුකූලව ආරක්ෂා කිරීම හා මහජනතාවගේ ඇගයීම, අධ්‍යාපනය සහ රසාස්වාදය උදෙසා ඉදිරිපත් කිරීම.

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ | - | 011-2695366 |
| ෆැක්ස් අංකය | - | 011-2692092 |
| පොදු දුරකථන අංකය | - | 011-2694767 |
| ඊමේල් ලිපිනය | - | nmdep@slt.lk |
| වෙබ් ලිපිනය | - | www.musuem.gov.lk |

# පටුන


පිටු අංකය

1. හැඳින්වීම 01

2. මූල්‍ය ප්‍රතිපාදන 02 - 03

3. ආයතනික කටයුතු 04 - 11

4. 2016 වර්ෂයේ කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ විශේෂ කාර්යයන් 11

5. කෞතුකාගාර නරඹන්නන් පිළිබඳ විස්තර 12

6. විවිධ විෂයානුබද්ධ අංශවල කටයුතු

6.(අ) සංස්කෘතික අංශය 13 - 15

6.(අ).1 මානවවංශ විද්‍යා අංශය

6.(අ).2 මානව විද්‍යා අංශය

6.(ආ) විද්‍යාත්මක අංශය 16 - 23

6.(ආ).1 උද්භිද විද්‍යා අංශය

6.(ආ).2 කීට විද්‍යා අංශය

6.(ආ).3 භූ විද්‍යා අංශය

6.(ආ).4 සත්ත්ව විද්‍යා අංශය

7. අධ්‍යාපන ප්‍රකාශන අංශය 23 - 25

8. ජාතික කෞතුකාගාර ශ්‍රවණාගාරය 25

9. ජාතික කෞතුකාගාර පුස්තකාලය 26

10. ඡායාරූප අංශය 26 - 28

11. සංරක්ෂණ අංශය 28 - 31

12. ප්‍රදර්ශන සැලසුම් අංශය 31

13. තොරතුරු තාක්ෂණ අංශය 32

14. කෞතුකාගාර කටයුතු 33 - 37

14.(අ) කොළඹ ජාතික කෞතුකාගාරය

14.(ආ) ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරය

14.(ඇ) මහනුවර ජාතික කෞතුකාගාරය

14.(ඈ) ඕලන්ද කෞතුකාගාරය

14.(ඉ) රත්නපුර ජාතික කෞතුකාගාරය

14.(ඊ) අනුරාධපුර ජන කෞතුකාගාරය

14.(උ) ගාල්ල ජාතික කෞතුකාගාරය

14.(ඌ) ගාල්ල සමුද්‍ර කෞතුකාගාරය

14.(එ) නිදහස් අනුස්මරණ කෞතුකාගාරය

14.(ඒ) මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය.

15. 2016 වර්ෂයේ ආදායම 38 - 39

16. ඡායාරූප 40 - 44

# 2017 වර්ෂය සඳහා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ කාර්යය සාධන වාර්තාව

## (1). හැඳින්වීම

අංග සම්පූර්ණ කෞතුකාගාර සේවාවක් රටට ලබාදීම ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වන්නේය. මෙම අරමුණ මුදුන්පත් කර ගැනීම සඳහා ක්‍රියාකිරීමේදී සාමාන්‍ය වශයෙන් කෞතුකාගාරයක් හා සම්බන්ධ නානාවිධ කාර්යය පථයන් අතරින් අප රටට වඩාත් උචිත වන්නා වු කාර්යය පථයන් තෝරා ගැනීමට දෙපාර්තමේන්තුවට සිදුවේ. මෙම තෝරා ගැනීමට අදාළ වන ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා දෙපාර්තමේන්තුවේ ප්‍රයෝජනය පිණිස ලබාගත හැකි විවිධ සම්පත් මෙන්ම රටේ අවශ්‍යතාවය ද සැලකීමට භාජනය කරනු ලැබේ.

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් මෙම ප්‍රතිපත්ති ප්‍රධාන කොටම ක්‍රියාත්මක කරනු ලබන්නේ, සමස්තයක් වශයෙන් මුළු රටම නියෝජනය කෙරෙන රැස්කිරීම් සම්භාරයකින් සමන්විත වු කොළඹ ජාතික කෞතුකාගාරය මඟිනි. මීට අමතරව කොළඹ ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරය, මහනුවර ජාතික කෞතුකාගාරය, රත්නපුර ජාතික කෞතුකාගාරය, ගාල්ල ජාතික කෞතුකාගාරය, ගාල්ල ජාතික සමුද්‍ර කෞතුකාගාරය, පිටකොටුවේ ඕලන්ද කෞතුකාගාරය, අනුරාධපුර ජන කෞතුකාගාරය, නිදහස් අනුස්මරණ කෞතුකාගාරය හා මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව මඟින් පවත්වාගෙන යනු ලබන අතර, එම ප්‍රදේශවලට ආවේණික සංස්කෘතික සහ ස්වභාවික විද්‍යා උරුමයන් ද විදහා දැක්වීම එකී කෞතුකාගාරවල කාර්යය භාරය වේ. එසේම ජංගම කෞතුකාගාර සේවය ද හේතුකොට ගෙන දෙපාර්තමේන්තුවේ සේවා පථය පුළුල් වී තිබේ. මේ අනුව ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව සතු කාර්යයන් පහත දැක්වෙන පරිදි විශ්ලේෂණය කර දැක්විය හැකිය.

I. ප්‍රාග් ඉතිහාසය, මානවවංශ විද්‍යාව, මානව විද්‍යාව, සත්ත්ව විද්‍යාව, කීට විද්‍යාව, භූ ගර්භ විද්‍යාව, උද්භිද විද්‍යාව හා පාෂාණධාතු විද්‍යාව යන විවිධ ක්ෂේත්‍රයන්ට අදාළ වන්නා වු වස්තූන් සහ ආදර්ශ රැස්කිරීම, ලේඛනාරූඪ කිරීම සහ ආරක්ෂා කිරීම.

II. යථෝක්ත ක්ෂේත්‍රයන්හි පර්යේෂණ පැවැත්වීම.

III. විද්වතුන්ගේ මෙන්ම ආධුනිකයන්ගේ ද ප්‍රයෝජනය පිණිස, ස්පෝලියා සෙලනිකා නමැති පර්යේෂණ සංග්‍රහය සහ වෙනත් සඟරා සහ ඒක විෂයක සංග්‍රහයන් ප්‍රකාශයට පත් කිරීම.

IV. රටේ ඉතිහාසය, කලා ශිල්ප හා ස්වාභාවික විද්‍යාවන්ට ද අදාළ වන්නා වූ දැනුම ප්‍රචලිත කිරීම වස් දේශන, ප්‍රදර්ශන හා සම්මන්ත්‍රණ ආදියෙන් සමන්විත අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## (2). මූල්‍ය ප්‍රතිපාදන

### (අ). පුනරාවර්තන වියදම්:

| | වෙන් කළ ප්‍රතිපාදන | 2017.12.31 දිනට වියදම | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| සාමාන්‍ය පරිපාලනය | රු.36,637,000 | රු.36,063,945 | 98% |
| කෞතුකාගාර අධ්‍යාපනය | රු.43,150,000 | රු.42,595,369 | 99% |
| කෞතුකාගාර සේවා | රු.107,178,000 | රු.106,236,485 | 99% |
| **එකතුව** | **රු.186,965,000** | **රු.184,895,799** | **99%** |

### (ආ). ප්‍රාග්ධන වියදම:

| | වෙන් කළ ප්‍රතිපාදන | 2017.12.31 දිනට වියදම | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| සාමාන්‍ය පරිපාලනය | රු.4,750,000 | රු.4,667,379 | 98% |
| කෞතුකාගාර අධ්‍යාපනය | රු.9,890,000 | රු.9,762,187 | 99% |
| කෞතුකාගාර සේවා | රු.55,274,000 | රු.53,046,215 | 96% |
| **එකතුව (මූලධන වියදම්)** | **රු.69,914,000** | **රු.67,475,781** | **97%** |
| **මුළු වියදම** | **රු.256,879,000** | **රු.252,371,580** | **98%** |

### (ඇ). 2017 වර්ෂයේ කෞතුකාගාර දෙපාර්තමේන්තුවට මිලදී ගත් භාණ්ඩ

- වැය ශීර්ෂ අංකය: 2102 - ගෘහභාණ්ඩ හා කාර්යාලයීය උපකරණ:-

| ව්‍යාපෘතිය | වියදම |
|---|---|
| සාමාන්‍ය පරිපාලනය | 1,119,131 |
| කෞතුකාගාර අධ්‍යාපනය | 5,215,944 |
| කෞතුකාගාර සේවා | 5,000,000 |

- වැය ශීර්ෂ අංකය: 2103 - යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ:-

| ව්‍යාපෘතිය | වියදම |
|---|---|
| සාමාන්‍ය පරිපාලනය | 478,225 |
| කෞතුකාගාර අධ්‍යාපනය | 1,000,000 |
| කෞතුකාගාර සේවා | 1,295,658 |

(ඇ). 2017 වසරේ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ව්‍යාපෘති

| | ව්‍යාපෘතිය | 2017 වර්ෂය සඳහා වෙන් කළ ප්‍රතිපාදන (රු.මිලි) | 2017.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය | 2017.12.31 දිනට භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| 01 | ලේඛනාගාර ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම | 1.2 | 100% | 100% |
| 02 | සත්ත්ව විද්‍යා ගොඩනැගිල්ලේ වහල අලුත්වැඩියා කිරීම | 2.9 | 100% | 100% |
| 03 | කොළඹ ජාතික කෞතුකාගාර ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරීම | 5.1 | 100% | 100% |
| 04 | කොළඹ ජාතික කෞතුකාගාර උද්‍යානය සංවර්ධනය කිරීම | 3.5 | 96% | 100% |
| 05 | කොළඹ ජාතික කෞතුකාගාරයේ CCTV පද්ධතියේ දෙවන අදියර | 22.5 | 100% | 100% |

## (3). ආයතනික කටයුතු

(අ). 2017 වර්ෂයේ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සංඛ්‍යාව 400 කි.

(ආ). 2017 වර්ෂයේ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අනුමත ශ්‍රේණි සංඛ්‍යාව හා දැනට සිටින කාර්ය මණ්ඩලය

| තනතුර | සේවය | වැටුප් කේතය | අනුමත කාර්යය මණ්ඩලය | දැනට සිටින කාර්යය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් ** | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය - විශේෂ | SL 3 | 1 | 0 | 1 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ** | ශ්‍රී ලංකා පරිපාලන සේවය I | SL 3 | 1 | 0 | 1 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ** | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය I | SL 3 | 1 | 0 | 1 |
| ප්‍රධාන ගණකාධිකාරී ** | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය I | SL 1 | 1 | 1 | 0 |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක ** | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය I | SL 1 | 1 | 1 | 0 |
| අධ්‍යක්ෂ * | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය I | SL 1 | | 1 | |
| අධ්‍යක්ෂ (විද්‍යා) ** | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය I | SL 1 | 1 | 0 | 1 |
| අධ්‍යක්ෂ (සංස්කෘතික) ** | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය I | SL 1 | 1 | 0 | 1 |
| සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා පරිපාලන සේවය III / II | SL 1 | 1 | 1 | 0 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (මානව වංශ විද්‍යා) | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය III / II | SL 1 | 1 | 1 | 0 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (මානව විද්‍යා) | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය III / II | SL 1 | 1 | 1 | 0 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (උද්භිද විද්‍යා) | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය III / II | SL 1 | 1 | 0 | 1 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (සත්ත්ව විද්‍යා) | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය III / II | SL 1 | 1 | 1 | 0 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (කීට විද්‍යා) | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය III / II | SL 1 | 1 | 1 | 0 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (කෞතුකාගාර සේවා) | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය III / II | SL 1 | 1 | 0 | 1 |
| ගණකාධිකාරී | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය III / II | SL 1 | 1 | 0 | 1 |
| පරිපාලන නිලධාරී | රාජ්‍ය කළමණාකරණ සහකාර සේවය (අධිපන්තිය) | MN 7 | 1 | 1 | 0 |

| | | | | | |
|---|---|---|---|---|---|
| පුස්තකාලාධිපති | ශ්‍රී ලංකා රජයේ පුස්ථකාලාධිපති සේවය (අධිපන්තිය) | MN 6 | 1 | 0 | 1 |
| භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක සේවය II / I | MN 6 | 2 | 1 | 1 |
| කෞතුකාගාර අධිකාරී | දෙපාර්තමේන්තුගත | MN 4 | 5 | 1 | 4 |
| සම්ප්‍රදායික කලා සහකාර | දෙපාර්තමේන්තුගත III / II / I | MN 4 | 1 | 1 | 0 |
| ප්‍රදර්ශන සැලසුම් නිලධාරී | දෙපාර්තමේන්තුගත III / II / I | MN 4 | 1 | 0 | 1 |
| අයවැය සහකාර | ආශ්‍රිත සේවා III / II / I | MN 4 | 1 | 0 | 1 |
| සංරක්ෂණ නිලධාරී | ආශ්‍රිත සේවා III / II / I | MN 4 | 2 | 0 | 2 |
| මිලදී ගැනීමේ නිලධාරී | ආශ්‍රිත සේවා III / II / I | MN 4 | 1 | 1 | 0 |
| පර්යේෂණ සහකාර | ආශ්‍රිත සේවා III / II / I | MN 4 | 8 | 2 | 6 |
| පර්යේෂණ සහකාර | දෙපාර්තමේන්තුගත | MN 4 | 6 | 0 | 6 |
| අධ්‍යාපන ප්‍රවර්ධන නිලධාරී | ආශ්‍රිත සේවා III / II / I | MN 4 | 18 | 8 | 10 |
| තොරතුරු තාක්ෂණ සහකාර | ආශ්‍රිත සේවා III / II / I | MN 4 | 1 | 0 | 1 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය 3 – III / II / I | MN 1 | 1 | 0 | 1 |
| වැඩසටහන් සහකාර | ආශ්‍රිත සේවා III / II / I | MN 4 | 1 | 1 | 0 |
| සංවර්ධන සහකාර | ආශ්‍රිත සේවා III / II / I | MN 4 | 2 | 0 | 2 |
| සංවර්ධන නිලධාරී | සංවර්ධන නිලධාරී සේවය III / II / I | MN 4 | 13 | 33 | 1 |
| සංවර්ධන නිලධාරී (දෙමළ) | සංවර්ධන නිලධාරී සේවය III / II / I | MN 4 | 7 | 0 | 7 |
| ප්‍රධාන ආරක්ෂක නිලධාරී | දෙපාර්තමේන්තුගත III / II / I | MN 4 | 1 | 0 | 1 |
| කෞතුකාගාර ආරක්ෂක | දෙපාර්තමේන්තුගත III / II / I | MN 3 | 10 | 2 | 8 |
| කීට විද්‍යා සහකාර | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය III / II / I | MN 3 | 2 | 0 | 2 |
| උද්භිත විද්‍යා සහකාර | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය III / II / I | MN 3 | 1 | 0 | 1 |
| භූ විද්‍යා සහකාර | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය III / II / I | MN 3 | 1 | 1 | 0 |
| මානව විද්‍යා සහකාර | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය III / II / I | MN 3 | 1 | 0 | 1 |
| සත්ත්ව විද්‍යා සහකාර | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය III / II / I | MN 3 | 1 | 0 | 1 |
| සංරක්ෂණ සහකාර | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය III / II / I | MN 3 | 1 | 0 | 1 |
| කාර්මික නිලධාරී | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය III / II / I | MN 3 | 2 | 0 | 2 |
| පුස්තකාලාධිපති | රජයේ පුස්තකාලාධිපති සේවය III / II / I | MN 3 | 4 | 2 | 2 |

| | | | | | |
|---|---|---|---|---|---|
| ඡායාරූප ශිල්පී | දෙපාර්තමේන්තුගත III / II / I | MT 3 | 1 | 1 | 0 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය III / II / I | MN 2 | 20 | 15 | 5 |
| චර්ම ශිල්පී | දෙපාර්තමේන්තුගත III / II / I | MN 1 | 1 | 1 | 0 |
| ආදර්ශ රූප කලාකරු | දෙපාර්තමේන්තුගත III / II / I | MN 1 | 3 | 2 | 1 |
| ආරක්ෂක සහකාර | දෙපාර්තමේන්තුගත III / II / I | MN 1 | 5 | 0 | 5 |
| කෞතුකාගාර පිළිගැනීමේ නිලධාරී | දෙපාර්තමේන්තුගත III / II / I | MN 1 | 1 | 0 | 1 |
| රියදුරු | ඒකාබද්ධ රියදුරු සේවය III / II / I | PL 3 | 8 | 5 | 3 |
| ලේඛන ප්‍රතිසංස්කාරක | දෙපාර්තමේන්තුගත III / II / I | PL 2 | 9 | 6 | 3 |
| උද්‍යාන පාලක | දෙපාර්තමේන්තුගත III / II / I | PL 2 | 2 | 1 | 1 |
| විදුලි කාර්මික | දෙපාර්තමේන්තුගත III / II / I | PL 2 | 1 | 1 | 0 |
| වඩු කාර්මික | දෙපාර්තමේන්තුගත III / II / I | PL 2 | 2 | 1 | 1 |
| පින්තාරුකරු | දෙපාර්තමේන්තුගත III / II / I | PL 2 | 1 | 1 | 0 |
| පෙදරේරු | දෙපාර්තමේන්තුගත III / II / I | PL 2 | 1 | 1 | 0 |
| ශ්‍රව්‍ය දෘශ්‍ය සහායක | දෙපාර්තමේන්තුගත III / II / I | PL 2 | 1 | 1 | 0 |
| මුර පරීක්ෂක | දෙපාර්තමේන්තුගත III / II / I | PL 1 | 1 | 1 | 0 |
| සහකාර මුර පරීක්ෂක | දෙපාර්තමේන්තුගත III / II / I | PL 1 | 1 | 0 | 1 |
| කෞතුකාගාර මුරකරු | දෙපාර්තමේන්තුගත III / II / I | PL 1 | 50 | 48 | 2 |
| පුස්තකාල සහායක | දෙපාර්තමේන්තුගත III / II / I | PL 1 | 2 | 2 | 0 |
| කෞතුකාගාර සහායක | දෙපාර්තමේන්තුගත III / II / I | PL 1 | 179 | 175 | 4 |

* නව කෞතුකාගාර පනත සම්මත වන තෙක් බලාත්මක වේ. දැනට නියෝජ්‍ය අධ්‍යක්ෂ (මානව විද්‍යා) අධ්‍යක්ෂ තනතුරේ පූර්ණ කාලීනව වැඩ බැලීම සිදුකරයි.

** දෙපාර්තමේන්තුව උත්ශ්‍රේණිගත කිරීම යටතේ අනුමත තනතුරු වේ.නව කෞතුකාගාර පනත සම්මත වන තෙක් බලාත්මක නොවේ.

*** පුරප්පාඩු නිලධාරීන් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වී ඇත.

***# එක් අයෙකු සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වී ඇති අතර, තවත් නිලධාරියෙකු දෙපාර්තමේන්තු සේවයෙන් මුදා හැර ඇත.

## කෞතුකාගාර අධිකාරී සහ ආශ්‍රිත සේවා නිලධාරීන්ගෙන් 21 දෙනෙකු ස.නි. සේවයට අන්තර්ග්‍රහණය වී ඇති අතර සංවර්ධන නිලධාරී සේවයට පත්වීම් ලද නිලධාරීන්ගෙන් එක් අයෙකු සඳහා පුරප්පාඩුවක් පවතී.

### (ඇ).නව පත්වීම් ලබා පැමිණි නිලධාරීන්

| අනු අංකය | නම | තනතුර | දිනය |
|---|---|---|---|
| 01 | පී.පී.ආර්.අයි.ගොඩකුඹුර මෙය | සංවර්ධන නිලධාරී | 2017.01.12 |
| 02 | කේ.ආර්.ඒ.එස්.අබේසිංහ මයා | සංවර්ධන නිලධාරී | 2017.01.16 |
| 03 | ඩබ්.ඒ.ඕ.ඩී.වීරසූරිය මයා | සංවර්ධන නිලධාරී | 2017.01.16 |
| 04 | එච්.පී.ටී.එස්.ජයසූරිය මයා | සංවර්ධන නිලධාරී | 2017.03.02 |
| 05 | ඩී.කේ.එස්.භාග්‍යා මෙය | සංවර්ධන නිලධාරී | 2017.02.07 |
| 06 | කේ.එම්.එම්.ටී.කුමාරි මෙය | සංවර්ධන නිලධාරී | 2017.02.09 |
| 07 | පී.පී.කේ.ටී.උභයවර්ධන මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2017.01.16 |
| 08 | ඒ.පී.පී.එච්.පී.අන්වාරම මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2017.01.16 |
| 09 | අයි.එම්.එච්.ඒ.කේ.අබේරත්න මයා | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 10 | ආර්.එම්.ඒ.එම්.රාජකරුණා මයා | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 11 | ආර්.එම්.ඕ.ඩී.ටී.රාජපක්ෂ මෙය | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 12 | ආර්.එම්.ඩී.සී.බණ්ඩාර මයා | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 13 | ආර්.එම්.එස්.එස්.විජේසේන මයා | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 14 | ආර්.ඩී.ඒ.කුමාර මයා | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 15 | ඊ.එම්.පී.ඩබ්.ඒ.ජේ.කුමාරි මෙය | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 16 | එච්.සමරසිංහ මයා | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 17 | එච්.එම්.පී.එම්.බණ්ඩාර මයා | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 18 | එච්.එම්.එන්.කේ.හේරත් මයා | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 19 | එච්.එම්.ආර්.ඒ.ජයතිලක මයා | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 20 | එච්.එම්.පී.පී.එස්.ඒ.කේ.හේරත් මයා | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 21 | එච්.පී.සී.ජේ.කුමාර මයා | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 22 | එච්.කේ.එස්.මධුශංක මයා | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 23 | එම්.සී.එස්.ජයතිස්ස මයා | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 24 | එම්.ආර්.දේශාන් මයා | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 25 | එම්.පී.එස්.කුමාර මයා | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 26 | එල්.ඒ.අයි.ඒ.ලියනආරච්චි මයා | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 27 | එස්.එම්.ඒ.එස්.සේනානායක මයා | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 28 | ඒ.ඩී.එස්.යූ.කුමාර මයා | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 29 | ඒ.ඒ.එස්.පී.අතුකෝරාල මයා | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 30 | ඒ.ටී.ඒ.මධුභාෂිණී මෙය | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 31 | පී.ඒ.ප්‍රියදර්ශනී මෙය | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 32 | පී.එන්.පී.හේමන්ති මිය | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 33 | පී.එන්.වික්‍රමරත්න මිය | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 34 | ටී.එම්.සී.ආර්.කුමාර මයා | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 35 | ඩබ්.එම්.ඒ.බී.විජේකෝන් මයා | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 36 | ඩබ්.එම්.දේවබන්දු මෙය | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 37 | ඩී.එම්.ඩබ්.එස්.බී.දිසානායක මයා | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 38 | ඩී.ඩබ්.ආර්.අනුරුද්ධ මයා | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 39 | පී.එම්.එච්.එස්.පතිරාජ මයා | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 40 | පී.පී.කේ.මධුරංග මයා | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 41 | පී.ඩබ්.අනෝශානි මෙය | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 42 | බී.ඒ.කේ.යූ.බමුණුසිංහ මිය | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 43 | යූ.කේ.ඩී.එස්.එම්.ගුණසේකර මිය | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 44 | වයි.ආර්.කුමාරසිරි මයා | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 45 | වයි.ආර්.එන්.දිමන්ත මයා | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 46 | වයි.පී.එස්.දිනුෂිකා මෙය | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 47 | බී.ඩබ්.එම්.එස්.කුමාර මයා | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 48 | ඒ.පී.දිසානායක මයා | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 49 | ඒ.බී.එස්.යූ.බණ්ඩාර මයා | කෞතුකාගාර සහායක | 2017.01.23 |

| | | | |
|---|---|---|---|
| 50 | කේ.එච්.පී.එස්.ජයතිස්ස මයා | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 51 | කේ.ඩී.එච්.එන්.වික්‍රමනායක මෙය | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 52 | කේ.පී.ඩී.නන්දනී මෙය | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 53 | කේ.පී.ඩී.සිරිවර්ධන මයා | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 54 | කේ.ඩබ්.පී.මධුෂිකා මෙය | කෞතුකාගාර සහායක | 2017.01.23 |
| 55 | එස්.එච්.ඩබ්.එම්.පවන්සි මෙය | කෞතුකාගාර සහායක | 2017.09.04 |
| 56 | බී.එම්.ඩී.එස්.කේ.බස්නායක මයා | කෞතුකාගාර සහායක | 2017.09.04 |
| 57 | කේ.එෆ්.රිෆ්කාන් මයා | කෞතුකාගාර සහායක | 2017.09.04 |
| 58 | කේ.එච්.බී.ටී.ජයශංඛ මයා | කෞතුකාගාර සහායක | 2017.09.04 |
| 59 | පී.පී.ආර්.ගලහිටියාව මෙය | කෞතුකාගාර සහායක | 2017.09.04 |
| 60 | ජේ.ඩී.ඩී.ඩී.අල්විස් මිය | කෞතුකාගාර සහායක | 2017.09.04 |
| 61 | ජේ.එම්.එස්.එස්.බණ්ඩාර මයා | කෞතුකාගාර සහායක | 2017.09.04 |
| 62 | කේ.යූ.අයි.බණ්ඩාර මයා | කෞතුකාගාර සහායක | 2017.09.04 |
| 63 | කේ.පී.එන්.ටී.ලක්මාල් මයා | කෞතුකාගාර සහායක | 2017.09.04 |
| 64 | එම්.ඩී.එම්.පී.පී.බී.මුල්ලේගම මයා | කෞතුකාගාර මුරකරු | 2017.02.02 |
| 65 | එම්.පී.බී.විජේවර්ධන මයා | කෞතුකාගාර මුරකරු | 2017.02.02 |
| 66 | බී.එස්.ඩී.එල්.ප්‍රභාත් මයා | කෞතුකාගාර මුරකරු | 2017.11.08 |
| 67 | එල්.පී.කේ.වීරසිංහ මයා | වඩු කාර්මික | 2017.11.15 |

**(ඈ). තනතුරු නාමය වෙනස් වූ නිලධාරීන්**

| අනු අංකය | නම | තනතුර | පත්වීම් දිනය |
|---|---|---|---|
| 01 | එච්.පී.අබේරත්න මයා | මුර පරීක්ෂක | 2017.08.20 සිට 2017.10.16 දක්වා |
| 02 | එස්.එච්.අයි.එන්.පුෂ්පකුමාර මයා | සහකාර මුර පරීක්ෂක | 2017.08.20 සිට 2017.11.06 දක්වා |
| 03 | පී.ඩී.යාපා මයා | සහකාර මුර පරීක්ෂක (වැඩ ආවරණ) | 2017.11.09 සිට මේ දක්වා |
| 04 | එස්.එච්.අයි.එන්.පුෂ්පකුමාර මයා | මුර පරීක්ෂක | 2017.11.07 සිට මේ දක්වා |

## (ඉ). 2017 වර්ෂයේ සංවර්ධන නිලධාරී තනතුර සඳහා අන්තර්ග්‍රහණය කළ නිලධාරීන්

**සංවර්ධන නිලධාරී II ශ්‍රේණිය සඳහා**

| අනු අංකය | නම | අන්තර්ග්‍රහණ කළ දිනය | අන්තර්ග්‍රහණන ලිපිය ලද දිනය |
|---|---|---|---|
| 01 | ඩබ්.ඩී.එම්.යූ.ජයසිංහ මිය | 2011.08.01 | 2017.08.15 |
| 02 | කේ.ඩී.එන්.ඩී.පෙරේරා මිය | 2011.08.01 | 2017.08.15 |
| 03 | පී.ටී.එම්.ද සිල්වා මිය | 2011.08.01 | 2017.08.17 |
| 04 | එස්.ඉන්දිකා මෙය | 2011.08.01 | 2017.08.25 |
| 05 | කේ.ඩී.ගුණවතී මිය | 2011.08.01 | 2017.08.24 |
| 06 | ආර්.වී.ඩී.එස්.අබේරත්න මයා | 2011.08.01 | 2017.11.13 |
| 07 | එස්.එච්.රංජිත් මයා | 2011.08.01 | 2017.12.27 |
| 08 | කේ.තැන්නෙගෙදර මයා | 2011.08.01 | 2017.10.16 |
| 09 | එස්.ආර්.එම්.එස්.සමරදිවාකර මිය | 2011.08.01 | 2017.09.12 |

**සංවර්ධන නිලධාරී III ශ්‍රේණිය සඳහා**

| අනු අංකය | නම | අන්තර්ග්‍රහණය කළ දිනය | අන්තර්ග්‍රණන ලිපිය ලද දිනය |
|---|---|---|---|
| 01 | එස්.ඩී.රාජපක්ෂ මිය | 2011.08.01 | 2017.02.14 |
| 02 | වයි.ටී.අබේනායක මිය | 2011.08.01 | 2017.02.14 |
| 03 | එල්.මාරසිංහ මිය | 2011.08.01 | 2017.04.17 |
| 04 | එන්.ඒ.සී.කේ.නිකපිටිය මිය | 2011.08.01 | 2017.06.06 |
| 05 | කේ.එල්.එස්.එස්.සුජීවනී මිය | 2011.08.01 | 2017.06.09 |
| 06 | කේ.ඒ.සමන්තිකා මිය | 2011.08.01 | 2017.08.14 |
| 07 | ඩබ්.ඒ.පී.එල්.නිශ්ශංක මයා | 2011.08.01 | 2017.08.22 |
| 08 | ඒ.ආර්.ඩී.පී.ප්‍රේමරත්න මිය | 2011.08.01 | 2017.08.14 |
| 09 | සී.පී.සී.පී.කුමාරි මිය | 2011.08.01 | 2017.04.11 |
| 10 | පී.ආර්.එස්.ගුණවර්ධන මිය | 2011.08.01 | 2017.11.06 |
| 11 | එම්.බුලත්සිංහල මිය | 2011.08.01 | 2017.11.29 |
| 12 | එච්.ඒ.ඩී.ජේ.හෙට්ටිආරච්චි මයා | 2011.08.01 | 2017.01.05 |

**සංවර්ධන නිලධාරී II ශ්‍රේණිය සඳහා උසස්වීම් ලද නිලධාරීන්**

| අනු අංකය | නම | අන්තර්ග්‍රහනය කළ දිනය | අන්තර්ග්‍රහන ලිපිය ලද දිනය |
|---|---|---|---|
| 01 | වයි.ටී.අබේනායක මිය | 2015.09.21 | 2017.10.26 |

**(ඊ).2017 වසරේ විශ්‍රාම ගිය නිලධාරීන්**

| අනු අංකය | නම | තනතුර | විශ්‍රාම ගිය දිනය |
|---|---|---|---|
| 01 | ඒ.දයානන්ද මයා | මැදිරි භාරකරු | 2017.01.02 |
| 02 | ඩී.එම්.ජේ.දහනායක මයා | කෞතුකාගාර ආරක්ෂක | 2017.01.21 |
| 03 | ආර්.ඒ.ඩී.කේ.රාමනායක මයා | කෞතුකාගාර ආරක්ෂක | 2017.05.08 |
| 04 | කේ.එම්.නවරත්න බණ්ඩාර මයා | මැදිරි භාරකරු | 2017.05.16 |
| 05 | එල්.සිරිසේන මයා | මැදිරි භාරකරු | 2017.05.25 |
| 06 | කේ.පී.එස්.රාජපක්ෂ මයා | මුර පරීක්ෂක | 2017.06.08 |
| 07 | එල්.ඒ.සුනිල් මයා | මැදිරි භාරකරු | 2017.10.19 |
| 08 | එච්.පී.අබේරත්න මයා | සහකාර මුර පරීක්ෂක | 2017.11.07 |
| 09 | කේ.පී.එස්.වික්‍රමසිංහ මයා | ටිකට් සහකාර | 2017.12.05 |

**(උ). ස්ථාන මාරුවීම් ලබා පැමිණි නිලධාරීන්**

| අනු අංකය | නම | තනතුර | පැමිණි දිනය |
|---|---|---|---|
| 01 | ඩබ්.එම්.ටී.ඩබ්.ඒ.කේ.තෝරදෙණිය මෙය | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2017.01.10 |

**(ඌ). ස්ථාන මාරුවීම් ලබා ගිය නිලධාරීන් -** නැත

**(එ). මුදාහරින ලද නිලධාරීන්**

| අනු අංකය | නම | තනතුර | දිනය |
|---|---|---|---|
| 01 | එන්.පී.එම්.පී.නෙත්තසිංහ මිය | සංවර්ධන නිලධාරී | 2017.05.02 |
| 02 | ඩබ්.ඒ.ඒ.යූ.විජේවික්‍රම මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2017.06.01 |

**(ඒ). තනතුර අතහැර ගිය නිලධාරීන් -** නැත

**(ඔ).ඉල්ලා අස්වී ගිය නිලධාරීන්**

| අනු අංකය | නම | තනතුර | අස් වූ දිනය |
|---|---|---|---|
| 01 | පී.වී.ජේ.ගුණරත්න මයා | කෞතුකාගාර සහායක | 2017.06.01 |
| 02 | ටී.එම්.රොසාන් මයා | කෞතුකාගාර සහායක | 2017.02.08 |
| 03 | පී.බී.ඩී.රාජකරුණා මයා | කෞතුකාගාර සහායක | 2017.01.24 |

**(ඕ).පත්වීම් භාර නොගත් නිලධාරීන්**

| අනු අංකය | නම | තනතුර | අස් වූ දිනය |
|---|---|---|---|
| 01 | එස්.එම්.ඕ.එස්.සේනානායක මිය | කෞතුකාගාර සහායක | 2017.06.21 |
| 02 | ඩබ්.ඒ.එස්.කුමාරසිංහ මයා | කෞතුකාගාර සහායක | 2017.02.08 |
| 03 | එච්.කේ.ජයන්ත මයා | කෞතුකාගාර සහායක | 2017.10.31 |

### (ඖ). විදේශීය සමුළු හා විදේශීය පුහුණු

| අනු අංකය | සහභාගි වු අය | තනතුර | පැවති රට | පුහුණුව පැවති දිනයන් |
|---|---|---|---|---|
| 01 | එස්.ටී.කස්තුරිආරච්චි මිය | අධ්‍යක්ෂ (වැ.බ.) | ප්‍රංශය | 2017.06.06 - 2017.06.10 |
| | | | තායිලන්තය | 2017.12.20 - 2017.12.24 |
| 02 | ජී.ඒ.එස්.වික්‍රමසිංහ මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ (මා.ව.වි.) | චීනය | 2017.01.08 - 2017.01.13 |
| 03 | ඩබ්.එෆ්.ඩී.පී.ප්‍රනාන්දු මයා | ප්‍රධාන අභ්‍යන්තර විගණක | චීනය | 2017.05.23 - 2017.06.14 |

**(04) 2017 වර්ෂයේ කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ විශේෂ කාර්යයන්**

- සංරක්ෂණමය අලුත්වැඩියා කටයුතු වලින් පසුව කොළඹ ජාතික කෞතුකාගාරය 2017.02.06 දින මහජනතාව සඳහා නැවත විවෘත කරන ලදි.

- සංරක්ෂණමය අලුත්වැඩියා කටයුතු වලින් පසුව මහනුවර ජාතික කෞතුකාගාරය 2017.04.04 දින මහජනතාව සඳහා නැවත විවෘත කරන ලදි.

- වාර්ෂිකව මැයි මස 18 දිනට යෙදී ඇති ජාත්‍යන්තර කෞතුකාගාර දිනය නිමිත්තෙන් Museums Contested Histories : Saying The Unspeakable In Museums යන තේමාව යටතේ ශ්‍රී ලංකාවේ කෞතුකාගාර දින සැමරුම රත්නපුර ජාතික කෞතුකාගාරයේ දී සිදු කරන ලදි.

- ශ්‍රී ලංකා ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා වෙත රුසියානු සමූහාණ්ඩුවේ ජනාධිපති ව්ලැඩිමීර් පුටින් මහතා විසින් ත්‍යාගයක් ලෙස පිරිනමන ලද කස්තාන කඩුව කොළඹ ජාතික කෞතුකාගාරයට බාර දීමේ උළෙල 2017.08.02 දින ජනාධිපති තුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදි.

- ජාතික ස්වාභාවික විද්‍යා කෞතුකාගාරයේ අභිනවයෙන් ඉදිකරන ලද අස්ථික විද්‍යා මැදිරිය, නවීකරණය කරන ලද භූ විද්‍යා මැදිරිය හා උද්භිද විද්‍යා මැදිරිය මහජනතාව සඳහා විවෘත කිරීමේ උත්සවය 2017.10.09 දින පවත්වන ලදි.

- චීන - ශ්‍රී ලංකා රාජතාන්ත්‍රික සම්බන්ධතා ආරම්භ වී වසර 60 ක් සම්පූර්ණ වීම සැමරීම සඳහා ශ්‍රී ලංකාවේ චීන තානාපති කාර්යාලය, අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය හා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව එක්ව " Gone With the Wind and Waves Maritime silk Road Chinese Cultural Relics Exhibition" නමින් තාවකාලික ප්‍රදර්ශනයක් 2017.12.20 වන දින කොළඹ ජාතික කෞතුකාගාරයේ දී ආරම්භ විය.

- ශ්‍රී ජයවර්ධනපුර, කැලණිය හා රුහුණු විශ්ව විද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් විශේෂ ආයතන පුහුණු වැඩසටහන් තුනක් මේ වසරේදී සංවිධානය කරන ලදී.

- අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව එක්ව, දකුණු කොරියාවේ සංස්කෘතික උරුම ජාතික පර්යේෂණ ආයතනය (NRICH –National Research Institute of Cultural Heritage) විසින් 2017.11.06 සිට 2017.11.14 දක්වා කෞතුක භාණ්ඩ සංරක්ෂණය පිළිබඳ වැඩමුළුවක් කොළඹ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේදී පවත්වන ලදි.

# (05). කෞතුකාගාර නරඹන්නන් පිළිබඳ විස්තර

2017 වර්ෂයේ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යනු ලබන කෞතුකාගාර නැරඹීම සඳහා පැමිණි නරඹන්නන්ගේ සංඛ්‍යාව පහත පරිදි වේ.

| | දේශීය | | විදේශීය | | පාසැල් | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **කෞතුකාගාරයේ නම** | **වැඩිහිටි** | **ළමා** | **වැඩිහිටි** | **ළමා** | **ගුරුවරු** | **ළමයි** | **නොමිලේ** | **එකතුව** |
| කොළඹ ජාතික කෞතුකාගාරය | 76,650 | 22,581 | 53,058 | 2,201 | 8,735 | 107,189 | 6785 | **277,199** |
| ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරය | 18,246 | 9,744 | 5,093 | 354 | 2,623 | 34,381 | 1122 | **71,563** |
| ඕලන්ද කෞතුකාගාරය | 1,727 | 109 | 1,577 | 28 | 17 | 103 | - | **3,561** |
| රත්නපුර ජාතික කෞතුකාගාරය | 6,811 | 1,517 | 58 | 02 | 694 | 11,304 | 80 | **20,466** |
| මහනුවර ජාතික කෞතුකාගාරය | 7,357 | 1,865 | 1,860 | 95 | 382 | 3,847 | 520 | **15,926** |
| ගාල්ල ජාතික කෞතුකාගාරය | සංරක්ෂණමය අලුත්වැඩියා කටයුතු සඳහා තාවකාලිකව වසා ඇත. | | | | | | | |
| සමුද්‍ර කෞතුකාගාරය | 12,836 | 2,960 | 2,620 | 322 | 2,066 | 27,334 | - | **48,138** |
| අනුරාධපුර ජන කෞතුකාගාරය | 4,465 | 1,010 | 147 | 02 | 436 | 3,804 | 1849 | **11,713** |
| නිදහස් අනුස්මරණ කෞතුකාගාරය | 12,296 | 811 | 546 | 102 | 1,267 | 11,285 | 115 | **26,422** |
| මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය | 796 | 179 | 42 | - | 29 | 214 | | **1,260** |
| **එකතුව** | **141,184** | **40,776** | **65,001** | **3,106** | **16,249** | **199,461** | **10,471** | **4762248** |

## (06). විවිධ විෂයානුබද්ධ අංශවල කටයුතු

### (අ). සංස්කෘතික අංශ

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ සංස්කෘතික අංශය, මානව වංශ විද්‍යා හා මානව විද්‍යා යන අංශ දෙකෙන් සමන්විත වේ. එක් එක් අංශවලට අයත් භාණ්ඩ එක්රැස් කිරීම, ප්‍රදර්ශනය, ගබඩා කිරීම, සංරක්ෂණය, ලේඛනගත කිරීම, අධ්‍යයනය හා අධ්‍යාපනය ලබා දීම මෙම අංශය මගින් සිදු කෙරෙන ප්‍රධාන කාර්යයන් වෙයි

## (1). මානව වංශ විද්‍යා අංශය

### (අ). හඳුනාගැනීම් හා ලේඛනගත කිරීම්

- මහාචාර්ය නිමල් ද සිල්වා මහතා විසින් භාරදෙන ලද කොඩි එකතුව (කොඩි 21 ක් ) 2017.1.1 සිට 2017.1.21 දක්වා ලේඛනගත කිරීම.
- රත්නපුර ජාතික කෞතුකාගාරයෙන් ලැබුණු මුක්කරු ආයුධ 02, පතල් කෞතුක භාණ්ඩ හඳුනාගෙන ලේඛනගත කිරීම.
- රත්නපුර ජාතික කෞතුකාගාරයෙන් ලැබුණු පාෂාණීභූත සත්තව අවශේෂ 04 ක් ලේඛනගත කිරීම.

  (2017.14.01 , 2017.15.01 , 2017.16.01 , 2017.17.01)
- කෞතුක භාණ්ඩ 02 ක් ( Somana cloth - 2017.05. 1 and Fork with Wooden handle 2017.03.1) හඳුනාගෙන ලේඛනගත කිරීම.

### (ආ). පර්යේෂණ

- 2015.05.08 දින ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව මඟින් අත්පත් කරගත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ වළස්මුල්ල කෑල්ල තඹ සන්නස කියවා එහි වර්ෂය හා එහි සඳහන් තොරතුරු පිළිබඳව (Spolia Zelanica) ග්‍රන්ථයට පර්යේෂණ ලිපියක් සකස් කිරීම.
- Ancient and Mediaeval Pandayan Coins of the Colombo National Museum නමින් Spolia Zelanica ග්‍රන්ථයට පර්යේෂණ ලිපියක් භාරදීම.
- 2017.05.09 සිට 13 දින දක්වා චීනයේ ෂැංග්හයි කෞතුකාගාරයෙන් ලැබුණු ආරාධනයක් අනුව, 2017.05.09 හා 12 දෙදින, ‘‘Sri Lanka and the silk road reflected by the Art and Archeology Material of Sri Lanka’’ මැයෙන් හා ‘‘Zen he and Sri Lanka’’ මැයෙන් දේශන 02 ක් පැවැත්වීම
- පොළොන්නරුව සංස්කෘතික උරුම සංරක්ෂණ ව්‍යාපෘතිය යටතේ 2017.06.21 දින පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පැවැති ජාත්‍යන්තර වැඩමුළුව සඳහා Sri lanka and the Silk road මැයෙන් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.
- මානව වංශ විද්‍යා මගින් සැකසීමට යෝජිත බුද්ධ ප්‍රතිමා නාමාවලියට අංශය සතු ගබඩාවේ ඇති සහ කොළඹ කෞතුකාගාරයේ ඇති බුද්ධ ප්‍රතිමාවල සියලු දත්ත හා ඡායාරූප ලබාගැනීම සහ බුද්ධ ප්‍රතිමා 72 ක් වර්ගීකරණය කිරීම.
- අතිගරු ජනාධිපතිතුමන් විසින් ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවට භාර දෙන ලද කස්තාන කඩුව සම්බන්ධයෙන් 2017.08.03 දින පර්යේෂණාත්මක විවරණයක් ඉදිරිපත් කිරීම

## (ඇ). ප්‍රදර්ශන

මානව වංශ විද්‍යා අංශය මඟින් මේ වසරේදී ජංගම ප්‍රදර්ශන 09 ක් පවත්වන ලදී. එසේම මහනුවර ජාතික කෞතුකාගාරයේ ප්‍රදර්ශන කටයුතු ප්‍රතිසංවිධානය කිරීම ද සිදුකරන ලදී.

## (ඈ). ක්ෂේත්‍ර චාරිකා

- බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ දැනුම් දීම මත සූරියගොඩ ශ්‍රී නරේන්ද්‍රාරාම රජමහා විහාරයේ ඇති කෞතුක භාණ්ඩ පිළිබඳ පරීක්ෂා කිරීමට යාම සහ එහි වූ කෞතුක භාණ්ඩ හා ඒවායේ අනාරක්ෂිත තත්ත්වය හමුවේ ඒවා ආරක්ෂා කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාවක් සකසා බෞද්ධ කටයුතු කොමසාරිස් වෙත වාර්තාවක් ලබා දීම.

## (ඉ).වැඩමුළු හා සම්මන්ත්‍රණ -

- කැළණිය විශ්ව විද්‍යාලයේ ඉතිහාසය හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් 28 දෙනෙකු සඳහා කෞතුකාගාර සම්බන්ධ දින 30ක පුහුණු පාඨමාලාවක් සංවිධානය කිරීම.
- රුහුණ විශ්ව විද්‍යාලයේ ඉතිහාසය හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් 06 දෙනෙකු සඳහා කෞතුකාගාර සම්බන්ධ දින 30 ක පුහුණු පාඨමාලාවක් සංවිධානය කිරීම.
- ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ඉතිහාසය හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් 15 දෙනෙකු සඳහා කෞතුකාගාර සම්බන්ධ මාස 03 ක සීමාවාසික පුහුණු පාඨමාලාවක් ආරම්භ කිරීම.

## (ඊ). බාහිර සේවා

- විශ්ව විද්‍යාල සිසුන් 60 කට පමණ කෞතුක භාණ්ඩ පිළිබඳ තොරතුරු ලබාදීම.
- පර්යේෂකයින් 10 දෙනෙකු සඳහා සේවා සැපයීම.

## (උ). වෙනත් කටයුතු

- රෙදිපිළි Vol - I yd ldis Vol - III පරිගණක ගතකර අවසන් කිරීම.
- පොළොන්නරුව පුරාණ උරුම කෞතුකාගාරයේ ප්‍රදර්ශන කටයුතු සංවිධාන කිරීම.
- මහනුවර හා රත්නපුර ජාතික කෞතුකාගාර, නිදහස් අනුස්මරණ කෞතුකාගාරය, කෞතුකාගාර පුස්තකාලය, සංරක්ෂණ අංශය, උද්භිද විද්‍යා අංශය, භූ විද්‍යා, ප්‍රදර්ශන සැළසුම් අංශය ආදී අංශවල අධීක්ෂණ කටයුතු.
- අංශයේ ඇති කෞතුක භාණඩ සමීක්ෂණය සඳහා අංශයේ නිළධාරීන් යොමු කිරීම.
- මානව වංශ විද්‍යා අංශය සඳහා කාසි ගබඩා අල්මාරි සකස් කිරීම.

## (2). මානව විද්‍යා අංශය

### (අ). රැස් කිරීම්, හඳුනා ගැනීම් හා ලේඛනගත කිරීම්.

| අනු අංකය | භාණ්ඩය | භාණ්ඩය අත්පත් කරගත් දිනය | භාණ්ඩය අත්පත් කරගත් ක්‍රමය | ලියාපදිංචි අංකය | ලියාපදිංචි කළ දිනය | භාණ්ඩය අත්පත් කරගත් ප්‍රදේශය |
|---|---|---|---|---|---|---|
| 01 | ග්‍රැමෆෝනය | 2017.06.27 | මුදලට | 2017.02.01 | 2017.06.30 | මහනුවර දිස්ත්‍රික්කයේ කඩුගන්නාව |
| 02 | හාග් මැන්ඩලීය | 2017.07.05 | පරිත්‍යාග | 2017.06.01 | | කොළඹ |
| 03 | පට කම්බාය | 2017.07.18 | පරිත්‍යාග | 2017.07.01 | | ගම්පහ |

එසේම මානව විද්‍යා අංශයටෙ අයත් භාණ්ඩ පහත දැක්වෙන කාණ්ඩ යටතේ වර්ගීකරණය කර ආංශික ලේඛනයන්හි ඇතුළත් කරන ලදී. එම කාණ්ඩ නම් මුළුතැන්ගෙයි උපකරණ, සංගීත භාණ්ඩ, වෙද උපකරණ, මිනුම් උපකරණ, පන් භාණ්ඩ හා මාලදිවයින් භාණ්ඩ එකතුව ආදී වශයෙනි.

### (ආ). පර්යේෂණ

- කොළඹ කෞතුකාගාරයේ ප්‍රදර්ශිත "ලාංකේය වෙස් මුහුණු කලාව" ප්‍රදර්ශනයේ විස්තර පුවරු සඳහා තොරතුරු එක් රැස් කිරීම.
- ශ්‍රී ලාංකේය වෙස්මුහුණු කලාවට අදාලව අම්බලන්ගොඩ ප්‍රදේශයේ සිදුකරන ලද ක්ෂේත්‍ර චාරිකාවට අදාල නිබන්ධය.

### (ඇ). ක්ෂේත්‍ර චාරිකා

- ශ්‍රී ලාංකේය වෙස්මුහුණු කලාවට අදාලව අම්බලන්ගොඩ ප්‍රදේශයේ සිදුකරන ලද ක්ෂේත්‍ර චාරිකාව.

### (ඈ). ජංගම ප්‍රදර්ශන

- මානව විද්‍යා අංශය මඟින් මේ වසරේ දී ජංගම ප්‍රදර්ශන 07 ක් පවත්වන ලදි.

### (ඉ). වෙනත්

- මානව විද්‍යා කෞතුක භාණ්ඩ එකතුව ඡායාරූපගත කිරීම
- මානව විද්‍යා භාණ්ඩ එකතුව සමීක්ෂණය කිරීම යටතේ ගබඩා අල්මාරි 07 ක භාණ්ඩ 1132 ක් සමීක්ෂණය කිරීම
- පොළොන්නරුව යෝජිත කෞතුකාගාරයේ කෘෂිකර්මාන්තයට අදාල මැදිරිය සඳහා තොරතුරු රැස්කිරීම
- මානව විද්‍යා දත්ත ගබඩාවට දත්ත ඇතුළත් කිරීම
- සීමාවාසික පුහුණු පාඨමාලාවට පැමිණි විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් හට අංශය පිළිබඳව අවබෝධයක් ලබාදීම.
- මීගමුව රුක්මණීදේවී කෞතුකාගාරයේ තිබෙන භාණ්ඩ විධිමත් අයුරින් ලේඛන ගත කිරීමට තෙදින වැඩමුළුවක් සඳහා පැමිණි ටවර් හෝල් රඟහල පදනමේ නිලධාරීන් තිදෙනෙකුට පුහුණුව ලබාදීම.

## (ආ). විද්‍යාත්මක අංශ.

උද්භිද විද්‍යා, කීට විද්‍යා, භූ විද්‍යා, සත්ත්ව විද්‍යා යන අංශ මෙයට අයත් වේ. ඒ ඒ අංශවලට අයත් භාණ්ඩ හා ආදර්ශක රැස්කිරීම, නඩත්තු කිරීම, ප්‍රදර්ශනය, එම භාණ්ඩ හා ආදර්ශක පිළිබඳ පර්යේෂණ කරන්නා වු බාහිර විද්වතුන්ට සහයෝගය ලබාදීම හා ජනතාව දැනුවත් කිරීමේ කටයුතු මෙම අංශ මගින්  කෙරෙන ප්‍රධාන කාර්යයන් වෙයි.

## (1). උද්භිද විද්‍යා අංශය.

### (අ). හඳුනා ගැනීම් සහ ලේඛන ගත කිරීම්

- පසුගිය වසරේ (2016)  ඔක්තෝම්බර් 06-08 දක්වා සිදු කළ (සීතාවක සහ කෑගල්ල ප්‍රදේශය තෙත් කලාපීය උද්භිද උද්‍යාන) වල සහ 2016 දෙසැම්බර් 14-20 දින වල පේරාදෙණිය උද්භිද උද්‍යානයේ සිදු කරන ලද ක්ෂේත්‍ර චාරිකා මඟින් රැස් කර සකස් කරන ලද  ශාකාගාර පත්‍රිකා හඳුනාගෙන ලේඛන ගත කරන ලදි.

### (ආ). සංරක්ෂණය කරන ලද භාණ්ඩ හා ආදර්ශක වල විස්තර

- උක්ත ක්ෂේත්‍ර චාරිකාවල දී රැස් කර ගන්නා ලද ශාක කොටස් වියළා සුදුසු පරිදි සංරක්ෂණය කර ශාකාගාර පත්‍රිකා බවට පත් කරන ලදි.

### (ඇ). ජංගම ප්‍රදර්ශන -

උද්භිද විද්‍යා අංශය මඟින් මෙම වසරේ දී ජංගම ප්‍රදර්ශන 03 ක් පවත්වන ලදී.

### (ඈ). බාහිර සේවා

- 2017.01.26 සිට 2017. 04.28 දක්වා 2017 නව බඳවා ගැනීම් අනුව බඳවා ගත් නව කෞතුකාගාර සේවක මණ්ඩලය පුහුණු කරවීම.
- 2017.05.16 සහ 2017.05.23 කැළණිය විශ්ව විද්‍යාලයේ ඉතිහාස විශේෂ උපාධි පාඨමාලාව හදාරන ශිෂ්‍ය ශිෂ්‍යයාවන් 12 දෙනෙකුහට උද්භිද විද්‍යාත්මක දේශන මාලාවක් සහ ප්‍රායෝගික පුහුණුවක් ලබා දීම.

### (ඉ). වෙනත් කටයුතු

- කෞතුකාගාර උද්‍යානයේ නඩත්තු කටයුතු /අධීක්ෂණ කටයුතු පිළිබඳ උපදෙස් අදාළ ආයතනයට ලබා දීම.
- කොළඹ කෞතුකාගාර භූමියේ ඇති කසල බැහැර කිරීම නිවැරදිව සිදු කිරීම සඳහා කසල බැහැර කිරීමේ නිසි ක්‍රියා පිළිවෙලක් හඳුන්වා දීම.
- උද්භිද විද්‍යා අංශයට අයත් ශාකාගාරය යාවත් කාලීන කිරීම.

- ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ උද්භිද විද්‍යා මැදිරියේ නවීකරණ කටයුතු වඩු අංශය සමඟ සිදු කිරීම.

- පෙබරවාරි 15 - නුගේගොඩ මහමායා විද්‍යාලයේ සිසුවියන්ට ශාක විද්‍යා මැදිරිය සම්බන්ධව දේශන පැවැත්වීම.

- මැයි 29 - කෞතුකාගාරය  නැරඹීම සඳහා පැමිණෙන්නන් සහ පාසල් සිසුන්ට පරිසර සංරක්ෂණය පිළිබඳව දැනුවත් කිරීමට යොදාගෙන තිබුණ ද මෙදින කිසිම පාසලක් කොළඹ කෞතුකාගාරය නැරඹීම සඳහා නොපැමිණි බැවින් ප.ව.12.00 සිට ප.ව.4.00 වන තෙක් වරින් වර පැමිණෙන නරඹන්නන්ට පරිසර සංරක්ෂණය පිළිබඳව දැනුවත් කෙරිණි.

- මැයි 30 - කෞතුකාගාර පරිශ්‍රය පිරිසිදු කිරීමට ශ්‍රමදානයක් සිදු කිරීම.

- මැයි 31 - කසල කළමණාකරන ක්‍රියාවලිය අධීක්ෂණය සඳහා දෙපාර්තමේන්තුවේ සෑම අංශයක්ම නියෝජනය වන පරිදි කාර්යය මණ්ඩලයේ දෙදෙනෙක් බැගින් කසල කළමණාකරන කමිටු පිහිටු වීම සහ ක්‍රියාවට නැංවීම.

- ජුනි 01 - දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය සහභාගීත්වයෙන් රුක් රෝපණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

- ජුනි 03 - ජෛව විවිධත්වය පිළිබඳව දේශනයක් පැවැත්වීමට කටයුතු කිරීම.

- ජුනි 05 - ජගත් පරිසර දිනය සමරමින් රත්නපුර ජාතික කෞතුකාගාර පරිශ්‍රයේ රුක් රෝපණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබුණ ද මෙදින රත්නපුර ප්‍රදේශයේ ඇතිව තිබූ ජල ගැලීම හේතු කොට ගෙන රත්නපුර ජාතික කෞතුකාගාරයේ ක්‍රියාකාරකම් ඇනහිට තිබුණ බැවින් මෙදින ඩෙංගු මර්දනය පිළිබඳව දේශනයක් කොළඹ මහනගර සභාවේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී අංශය මගින් කොළඹ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ දී පැවැත්වීම.

- ජූලි 03 - ශ්‍රී ලංකා වනජීවී පර්යේෂණ හා පුහුණු කේන්ද්‍රයේ නිලධාරී වනජීවී ආරක්ෂක මහතුන්ට වැඩමුළුව සංවිධානය කිරීම.

- අගෝස්තු 08 - ශ්‍රී ලංකා වනජීවී පර්යේෂණ හා පුහුණු කේන්ද්‍රයේ නිලධාරී වනජීවී නියාමක මහතුන්ට වැඩමුළුව සංවිධානය කිරීම.

- දෙපාර්තමේන්තුවේ කසල බැහැර කිරීම අධීක්ෂණය කිරීම සඳහා සහභාගී වීම.

## (2). කීට විද්‍යා අංශය

### (අ). අදාළ වර්ෂය තුළ සිදුකරන ලද රැස් කිරීම්

- වස්ගමුව ජාතික වනෝද්‍යානය, වෙහෙරගල රක්ෂිත ආදී ප්‍රදේශයන්හි සිදුකරන ලද ක්ෂේත්‍ර චාරිකාව මගින් නිදර්ශක 200 ක් පමණ රැස් කරන ලදී.

### (ආ). හඳුනා ගැනීම් හා ලේඛන ගත කිරීම්

- 2016 වසරේ රැස්කරන ලද නිදර්ශක අතරින් මේ දක්වා හඳුනාගත් නිදර්ශක 102 ක් ලැයිස්තු ගත කිරීම.

## (ඇ). පර්යේෂණ

- Orthoptera ගෝත්‍රයේ නිදර්ශක ලැයිස්තුව යාවත්කාලීන කර පර්යේෂණ පත්‍රිකාවක් සැකසීම සඳහා 50 ක් පමණ ප්‍රමාණයක් ලැයිස්තුගත කර අවසන් කර ඇත.
- 2016 වසරේ රැස්කරන ලද නිදර්ශක සංඛ්‍යාවෙන් 102 ක් පමණ family මට්ටමට හඳුනාගෙන අවසන් කර ඇත.

## (ඈ). ක්ෂේත්‍ර චාරිකා

- 2017-08-24 සිට 28 දක්වා වස්ගමුව ජාතික වනෝද්‍යානය, වෙහෙරගල රක්ෂිත ආදී ස්ථාන වෙත ගමන් කර නිදර්ශක රැස් කිරීම සිදුකරන ලදී.

## (ඉ). ස්ථිර/තාවකාලික හා ජංගම ප්‍රදර්ශන

- කීට විද්‍යා අංශය මඟින් මේ වසරේ ජංගම ප්‍රදර්ශන 08 ක් පවත්වන ලදී.

## (ඊ). වැඩමුළු හා සම්මන්ත්‍රණ

- කැලණිය විශ්වවිද්‍යාලයේ ඉතිහසය හදාරන ශිෂ්‍ය කණ්ඩායමක් සඳහා ''කීට විද්‍යා අංශයේ කාර්ය භාරය'' යන මැයෙන් ආයතනික පුහුණුව ලබාදීම (2017.05.03 සිට 2017.05.31 දක්වා)
- ශ්‍රී ලංකා වනජීවී පුහුණු කේන්ද්‍රයේ පුහුණුව ලබන නිලධාරීන් සඳහා පවත්වන ලද වැඩමුළුව (2017-07-03)
- ශ්‍රී ලංකා වනජීවී පුහුණු කේන්ද්‍රයේ පුහුණුව ලබන නිලධාරීන් සඳහා පවත්වන ලද වැඩමුළුව (2017-08-08)
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය - ශිෂ්‍යාවන්ගේ සීමාවාසික පුහුණුව වෙනුවෙන් කීට විද්‍යා අංශයේ පුහුණුව ලබාදීම.

## (උ). බාහිර සේවා

- මාතර අතිරේක මහෙස්ත්‍රාත් අධිකරණ නඩු අංක BR/1685/16 දරණ නඩුවට අදාල ව්‍යාප්ති වාර්තාව ලබාදීම.
- කොළඹ මහ නගර සභාවෙන් එවනු ලැබූ 455/CA/MF/291 හා 455/CA/MF/292 දරණ උම්බලකඩ සාම්පල් වලට අදාල හඳුනා ගැනීමේ වාර්තාව ලබා දීම.
- කොළඹ මහ නගර සභාවෙන් එවනු ලැබූ 604/CA/MF/378 දරණ බත් පාර්සලයට අදාල හඳුනා ගැනීමේ වාර්තාව ලබා දීම.
- 2017.05.22 දින කොළඹ විශ්ව විද්‍යාලයේ සත්ත්ව විද්‍යා විශේෂ උපාධිය හදාරන 3 වසර හා 4 වසර සිසුන් සඳහා ජලජ කෘමීන් අධ්‍යයනයට අවශ්‍ය පර්යේෂණ පහසුකම් සැපයීම.

### (ඍ). වෙනත් කටයුතු

- ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ කීට විද්‍යා මැදිරිය සඳහා නව සැලැස්මක් සකස් කිරීම හා දැනට පවතින මැදිරිය නඩත්තු කිරීම.
- කෞතුකාගාර භූමියේ සකසා තිබෙන සමනල උයනේ නඩත්තු කටයුතු සිදු කිරීම.
- ජාතික විද්‍යා පදනම මඟින් සංවිධානය කරන ලද Reseach & Development survey සඳහා කෞතුකාගාර දෙපාර්තමේන්තුවට අදාල දත්ත රැස්කිරීම
- 2015 වසරේ විද්‍යාත්මක ප්‍රකාශන සඳහා වන කුෂලතා සම්මානයක් How many Species of *Paradoxurus* Civets Are There? New Insinght from India and Sri Lanka. ලෙස Journal of Zoological systematics and Evolutionary Research යන සඟරාවේ කාණ්ඩ 53 (2) හි පිටු අංක 161 - 174 පළ කරන ලද ප්‍රකාශනය සඳහා ලැබීම

## (3). භූ විද්‍යා අංශය.

### (අ) හඳුනා ගැනීම් සහ ලේඛන ගත කිරීම්

බෙල්ලන්බැඳි පැලැස්ස ප්‍රාග් ඓතිහාසික මානව අස්ථි එකතුවේ හිස් කබල් අස්ථි වර්ගීකරණය කිරීම මඟින් එම එකතුවට අයත් මානවයින් ඔවුන්ගේ වයස් අනුව හඳුනා ගැනීම.

මෙම හඳුනා ගැනීමේ ක්‍රියාවලිය සඳහා ප්‍රායෝගික අස්ථි විද්‍යාත්මක පුහුණුව පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය ආචාර්ය එච්.ආර්.ඩී. පීරිස් මහතා මඟින් භූ විද්‍යා අංශ නිලධාරීන් වෙත ලබා දුන් අතර මෙහි දී හිස් කබල් අස්ථි කොටස් 200 ක් පමණ හඳුනා ගන්නා ලදි. එම අස්ථි අතුරින් අධෝහනු 10 ක සම්පූර්ණ දන්ත විද්‍යානුකූල මූලධර්මයන්ට අනුකූලව ලේඛන ගත කිරීම හා රූපසටහන් ගොඩනැගීම සිදු කර ඇත.

### (ආ). පර්යේෂණ

- බෙල්ලන්බැඳි පැලැස්ස ප්‍රාග් ඓතිහාසික මානව අස්ථි එකතුවේ පවතින අධෝහනු අස්ථි අධ්‍යයනය මඟින් එම ප්‍රාග් ඓතිහාසික ජනාවාසයේ ජීවත් වූ මානවයින් සංඛ්‍යාව නිර්ණය කිරීම.

### (ඇ). ස්ථිර ප්‍රදර්ශන

- භූ විද්‍යා ස්ථිර ප්‍රදර්ශන මැදිරියේ ලෝක ගෝල ආකෘතියේ මූලික කටයුතු රජයේ කර්මාන්ත ශාලාව මඟින් නිමකර මෝටරය සවි කිරීම) භූ විද්‍යා ස්ථිර ප්‍රදර්ශන මැදිරියෙහි සවි කිරීම.
- භූ විද්‍යා ස්ථිර ප්‍රදර්ශන මැදිරිය සඳහා ආකෘති නිර්මාණ කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු මෝස්තර සම්පාදක අංශයට ලබා දීම.

### (ඈ). වැඩමුළු හා සම්මන්ත්‍රණ

- කැළණිය විශ්ව විද්‍යාලයේ ඉතිහාසය හදාරන ශිෂ්‍ය කණ්ඩායමක් සඳහා 2017.05.23 යන දෙදින තුළ භූ විද්‍යා විෂය සම්බන්ධව ප්‍රායෝගික පුහුණුවක් ද ඇතුළත් වැඩමුළුවක් භූ විද්‍යා අංශය තුළ දී පවත්වන ලදි.

- ගිරිතලේ වන ජීවී දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පිරිසකට 2017.09.03 දින භූ විද්‍යා විෂය සම්බන්ධව වැඩමුළුවක් භූ විද්‍යා අංශය තුළ දී පවත්වන ලදි.

### (ඉ). බාහිර සේවා

භූ විද්‍යා ආදර්ශක සම්බන්ධයෙන් පර්යේෂණ කිරීම සඳහා පහත සඳහන් පර්යේෂකයන් හට අවශ්‍ය සහයෝගය හා තොරතුරු ලබාදීම.

| අංකය | පර්යේෂකයා | දිනය | අධ්‍යනය කරන ලද ආදර්ශක එකතුව |
|---|---|---|---|
| 01 | පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය ආචාර්යය එච්. ආර්.ඩී. පීරිස් | 2017.01.01 සිට මේ දක්වා | බෙල්ලන්බැඳි පැලැස්ස මානව අස්ථි අධ්‍යයනය |
| 02 | කැළණිය විශ්ව විද්‍යාලයේ<br>සොනාලි ප්‍රේමරත්න මෙනවිය | 2017.01.01 සිට මේ දක්වා | බෙල්ලන්බැඳි පැලැස්ස මානව අස්ථි අධ්‍යයනය හා වේලන්ඩ් ගල් ආයුධ එකතුව |
| 03 | වෛද්‍ය හිමන්ත අතුකෝරල | 2017 මැයි මස | බෙල්ලන්බැඳි පැලැස්ස මානව අස්ථි අධ්‍යයනය |
| 04 | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සිසුන් පිරිසක් | 2017.03.08 | බටදොඹලෙන ප්‍රාග් ඓතිහාසික මානව අස්ථි එකතුව හා බෙල්ලන්බැඳි පැලැස්ස මානව අස්ථි අධ්‍යයනය |
| 05 | රජරට විශ්ව විද්‍යාලයේ S.W.A.K දර්ශිත මයා | 2017 අගෝස්තු | ප්ලයිස්ටොසීන පොසිල එකතුව |

## (4). සත්ත්ව විද්‍යා අංශය

### (අ). අදාළ වර්ෂය තුළ සිදුකරන ලද රැස් කිරීම්

- ජනවාරි මස පේරාදෙණිය පශු වෛද්‍ය පීඨයෙන් දිවියන් තිදෙනෙකු සංරක්ෂණය සඳහා රැගෙන එන ලදි.

### (ආ). හඳුනාගැනීම් හා ලේඛනගත කිරීම්.

- ආචාර්ය කණිෂ්ක උකුවෙල මහතා (රජරට විශ්වවිද්‍යාලය) *Eutropis bibronii* ආදර්ශකය පරිත්‍යාග කරන ලදි.

- මහාචාර්ය මාධව මීගස්කුඹුර මහතා විසින්

  *Pseudophilars schneideri (Family Rhacophorodae)*

  *Pseudophilautis hankeni*

  *Microhyla mihintalei (Holotype) (Family microbylidae)*

*Hylarana serendipl (Ranidae) (Paratype)*

*Hyloiai serendipi (Family Ranidae – Holotype)* යන සත්ත්ව නිදර්ශකය පරිත්‍යාග කිරීම.

- සිකනලුන් එකතුව නැවත යාවත්කාලීන කිරීම සහ ලේඛනගත කර අවසන් කිරීම.
- WHT එකතුවේ මත්ස්‍ය නිදර්ශක යාවත්කාලීන කිරීම සහ ලේඛනගත කර අවසන් කිරීම.

### (ඇ) පර්යේෂණ

- නව ජංගම ප්‍රදර්ශන සඳහා ක්ෂීරපායීන්, උරගයින්, පක්ෂීන් පිළිබඳ ප්‍රදර්ශන පුවරු සැකසීම.
- අස්ථික මැදිරියේ විස්තර ඇතුළත් අත් පත්‍රිකාවක් භාෂා ත්‍රිත්වයෙන්ම සැකසීම.

### (ඈ). ස්ථිර/තාවකාලික හා ජංගම ප්‍රදර්ශන

- ජාතික ස්වාභාවික විද්‍යා කෞතුකාගාරයේ අස්ථික මැදිරියේ ප්‍රදර්ශනය සඳහා අවශ්‍ය ප්‍රදර්ශන භාණ්ඩ සැකසීම.
- ජාතික ස්වාභාවික විද්‍යා කෞතුකාගාරයේ ක්ෂීරපායින්ගේ මැදිරියේ සත්ත්ව ආදර්ශක සියල්ල අලුත්වැඩියා කිරීම.
- උරග ජීවී මැදිරියේ සත්ත්ව ආදර්ශක සියල්ල නැවත සංරක්ෂණය සිදුකිරීම.
- පරිසර මැදිරියේ සත්ත්ව ආදර්ශක සියල්ල නැවත සංරක්ෂණය සිදුකිරීම.

### (ඉ). තාවකාලික ප්‍රදර්ශන

- සත්ත්ව විද්‍යා අංශය මඟින් මේ වසරේ දී ජංගම ප්‍රදර්ශන 08 ක් පවත්වන ලදී.

### (ඊ). වැඩමුළු හා සම්මන්ත්‍රණ

- Mobile Application ව්‍යාපෘතිය සහ කෞතුකාගාරය සඳහා ඩිජිටල් පුවරු ස්ථාපිත කිරීම අදාළව සියලුම කෞතුකාගාර අධිකාරීන් සහ ස්ථානභාර නිළධාරීන්ට එක්දින වැඩමුළුවක් පැවැත්වීම.

### (උ). බාහිර සේවා

- කොළඹ විශ්ව විද්‍යාලය හා පරිසර විද්‍යා අංශයේ සිසුන් සඳහා උරගයින් පක්ෂීන් හා ක්ෂීරපායින් අධ්‍යනයට පහසුකම් සැපයීම.
- රජරට විශ්ව විද්‍යාලයේ පුරාවිද්‍යා විශේෂවේදී ශිෂ්‍යයින් සඳහා සත්ත්ව විද්‍යා අංශය සහ එහි කර්තව්‍යය අවබෝධ කරදීමට දේශනයක් පැවැත්වීම.
- බ්‍රිතාන්‍යයේ බ්‍රිස්ටල් විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන සිසුවකු සඳහා *Hipposidiros lankadiva* ( Indion roundleaf bat ) අධ්‍යනයට පහසුකම් සැපයීම.

- රුහුණ විශ්ව විද්‍යාලයේ මහාචාර්යවරයෙකු සඳහා WHT එකතුවේ මත්ස්‍ය නිදර්ශක අධ්‍යයනයට පහසුකම් සැපයීම.

- Paige Langle මහතාට ඔහුගේ අධ්‍යයන සඳහා සත්ත්වයාගේ හිස් කබලේ දිග ලබාදීම.

- කොළඹ විශ්ව විද්‍යාලයේ සිසුන් සඳහා Molluscs and insects අධ්‍යනයට අවශ්‍ය පහසුකම් සැපයීම.

- An ecological Review on the skinks in sri lanka යන මාතෘකාව ඔස්සේ නිදහස් පර්යේෂකයන් දෙදෙනෙකුට සිකනලුන් එකතුව අධ්‍යයනයට පහසුකම් සැපයීම.

- කැලණිය විශ්ව විද්‍යාලයේ ඉතිහාසය හදාරන ශිෂ්‍ය කණ්ඩායම සඳහා "සත්ත්ව විද්‍යා අංශයේ කාර්යභාරය මැයෙන්" 2017.06.03 - 2017.06.30 දක්වා ආයතනික පුහුණුව ලබාදීම

- ගිරිතලේ වනජීවී කේන්ද්‍රයේ නිලධාරීන් සඳහා සත්ත්ව ආදර්ශක අධ්‍යයනයට අවශ්‍ය පහසුකම් සැපයීම.

- විවෘත විශ්ව විද්‍යාලයේ විද්‍යාවේදී උපාධිය හදාරන සිසුන් සඳහා සත්ත්ව ආදර්ශක අධ්‍යයනයට අවශ්‍ය පහසුකම් සැපයීම සහ දේශනයක් පැවැත්වීම සහ එහි සාමාජිකයන් සඳහා උරග සත්ත්ව ආදර්ශක අධ්‍යනයට හා ඡායාරූපගත කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම.

- තරුණ සත්ත්වවේදීන්ගේ සංගමයේ විභූෂණ බණ්ඩාර මහතාට Felidae පවුලට අයත් නිදර්ශක වල හිස්කබල් අධ්‍යනයට පහසුකම් සැපයීම.

- කොළඹ විශ්ව විද්‍යාලය මඟින් සංවිධානය කරනු ලබන වනජීවී පුහුණු ඩිප්ලෝමාව හදාරන සිසුන් සඳහා ජුලි 27 සිට අගෝස්තු 30 දක්වා අධ්‍යයනයට අවශ්‍ය පහසුකම් සැපයීම. එහිදි සත්ත්ව විද්‍යා අංශයට අදාළව දේශන පවත්වන ලදි.

- ගිරිතලේ වනජීවී පුහුණු පාඨමාලාව හදාරන නිලධාරීන් සඳහා පුහුණු වැඩමුළුවක් (දෙවන අදියරට අදාළව) හා අධ්‍යයනයට අවශ්‍ය පහසුකම් සැපයීම.

- රජරට විශ්ව විද්‍යාලයේ අචාර්ය කණිෂ්ක උකුවෙල මහතාට සිකනලු නිදර්ශක අධ්‍යයනයට පහසුකම් සැපයීම හා එම සත්ත්ව ආදර්ශක කෞතුකාගාර එකතුවට එක් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සිසුන් සඳහා සත්ත්ව අස්ථි පද්ධති අධ්‍යයනයට පහසුකම් සැපයීම හා දේශන පැවැත්වීම.

- කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිතව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නව වනජීවී අඩවි භාරකරුවන් සඳහා දින 03 ක පුහුණු සැසියක් පැවැත්වීම.

## (උ). වෙනත් කටයුතු

### 1. අධිකරණ වාර්තා

- 2017.01.04 දින තෙල්දෙණිය අධිකරණයේ නඩු අංක බී 434 /16 දරණ නඩුවට අදාළ වාර්තාව සැපයීම.

- 2017.05.26 මහනුවර මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බී 4250/2017 දරණ නඩුවට අදාළ වාර්තාව සැපයීම.

- 2017.10.23 දින නාගරික විශ්ලේෂක සඳහා 750/CA/MF/459 දරණ නඩුවට අදාළ වාර්තාව සැපයීම.

- 2017.11.06 ගම්පහ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බී/ 1883/17 දරණ නඩුවට අදාළ වාර්තාව සැපයීම.

- 2017.12.05 මහව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක ම/උ බී 1052/2017 දරණ නඩුවට අදාලව වාර්තාව සැපයීම.

- 2017.12.13 අලුත්කඩේ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 8/83689 දරණ නඩුවට අදාලව වාර්තාව සැපයීම.
- 2017.12.22 මහව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බී/1052/17 දරණ ගල්ගමුවේ දළ පුට්ටුවා නැමති ඇතාගේ යැයි සැලකෙන නඩු භාණ්ඩවලට අදාල වාර්තාව සැපයීම.

2. වෙනත්

- ඩිජිටල් පුවරු කෞතුකාගාර සඳහා ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා මෘදුකාංග නිර්මාණ ව්‍යාපෘතිය සම්බන්ධීකරණ කටයුතු සහකාර අධ්‍යක්ෂ (සත්ත්ව විද්‍යා) මඟින් සිදු කරන ලදී.
- පක්ෂි එකතුව ඡායාරූප ගත කිරීම අප දෙපාර්තමේන්තුවේ ඡායාරූප අංශය සමඟ සිදුකිරීම ආරම්භ කරන ලදී.

## (7). අධ්‍යාපන හා ප්‍රකාශන අංශය.

### (අ). කෞතුකාගාර ජංගම ප්‍රදර්ශන

මෙම වසර තුළදී අධ්‍යාපන හා ප්‍රකාශන අංශය මගින් ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ විවිධ අංශ හා එකතුව කෞතුකාගාර ජංගම ප්‍රදර්ශන 25 ක් සංවිධානය කරන ලදී.

| ප්‍රදර්ශනය පැවති ස්ථානය | පැවැත් වූ දිනය |
|---|---|
| • මාතර සුජාතා විද්‍යාලය | 2017.01.04 |
| • ර/සීවලී මහා විද්‍යාලය | 2017.01.26 - 27 |
| • සබරගමුව විශ්ව විද්‍යාලය | 2017.02.01 - 02 |
| • ඩී.එස්.සේනානායක විද්‍යාලය, කොළඹ | 2017.02.15 - 17 |
| • බුද්ධ ජයන්ති මධ්‍ය මහා විද්‍යාලය, බළන්ගොඩ | 2017.02.21 - 23 |
| • දන්කොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 2017.02.23 - 25 |
| • කෑගල්ල ශාන්ත මරියා විද්‍යාලය | 2017.03.01 - 04 |
| • ශාන්ත අන්තෝනි විද්‍යාලය, මට්ටක්කුලිය | 2017.03.02 - 03 |
| • කෑගල්ල වට්ටාරම රජමහා විහාරය | 2017.05.07 - 13 |
| • අරලියගහ මන්දිරය බුද්ධ රශ්මි වෙසක් කලාපය | 2017.05.10 - 14 |
| • කඩවත මහර වෙසක් කලාපය | 2017.05.10 - 13 |
| • ශාන්ත තෝමස් විද්‍යාලය, බණ්ඩාරවෙල | 2017.05.17 - 21 |
| • අනුරාධපුර ජන කෞතුකාගාරය | 2017.06.08 - 10 |

- මදුරුකැටිය කනිටු විදුහල, මොණරාගල 2017.06.10 - 11
- ශ්‍රී විජයනන්දනාරාමය, පිළියන්දල 2017.06.26
- හර්මන් මයිනර් විද්‍යාලය, පිළියන්දල 2017.06.27 - 2017.07.01
- තරුණ සේවා සභාව, මහරගම 2017.07.27 - 31
- සූරියවැව ජාතික පාසල, හම්බන්තොට 2017.09.20 - 24
- සෙනරත් පරණවිතාන විද්‍යාලය, උඩුගම්පොළ 2017.10.11 - 15
- අගමැති බාලිකා විද්‍යාලය, පානදුර 2017.10.28 - 29
- බිබිලේගම මහ විද්‍යාලය, ගොඩකවෙල 2017.10.25 - 27
- කැලණිය විශ්වවිද්‍යාලය 2017.11.30
- ශ්‍රී දේවරක්ෂිත ප්‍රාථමික විද්‍යාලය, කිරිඇල්ල 2017.12.05 - 06
- ශ්‍රී ධර්මාරාමය, හුණුපිටිය 2017.12.16 - 17
- ශ්‍රී සද්ධර්මාරාම පුරාණ ටැම්පිට විහාරය - කිරිඳිවැල 2017.12.25 - 31

## (ආ). ප්‍රකාශන කටයුතු

මෙම වසර තුළදී අධ්‍යාපන හා ප්‍රකාශන අංශය මගින් මුද්‍රණය කරන ලද ප්‍රකාශන පහත පරිදි වේ.

- කොළඹ ජාතික කෞතුකාගාරය සංරක්ෂණමය අළුත්වැඩියාවෙන් පසු නැවත විවෘත කිරීමේ උත්සවය වෙනුවෙන් ආරාධනා පත්‍ර සහ සමරු අත් පත්‍රිකා මුද්‍රණය කිරීම.
- මහනුවර ජාතික කෞතුකාගාරයේ සංරක්ෂණමය අළුත්වැඩියාවෙන් පසු නැවත විවෘත කිරීමේ උත්සවය වෙනුවෙන් ආරාධනා පත්‍ර සහ සමරු අත් පත්‍රිකා මුද්‍රණය කිරීම.
- 2016 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව මුද්‍රිත පිටපත් 70 ක් සහ සංයුක්ත තැටි 355 මුද්‍රණය කිරීම.
- SIGIRI GRAFFITI Vol: I පිටපත් 500 ක් මුද්‍රණය කිරීම.
- අරලියගහ මන්දිරයෙහි පැවැති බුද්ධ රශ්මි වෙසක් කලාප ප්‍රදර්ශනය වෙනුවෙන් Pull Up Stand වර්ගයේ බැනරයක් නිර්මාණය කිරීම.
- එක්සත් ජාතීන්ගේ වෙසක් දින උළෙල ( 2017 ) හා ලෝක බෞද්ධ සමුළුවට සුබ පැතුම් එක් කරමින් බැනරයක් සැකසීම.
- අස්ථික විද්‍යා මැදිරිය සඳහා අත් පත්‍රිකාවක් මුද්‍රණය කිරීම
  - සිංහල - 5000
  - ඉංග්‍රීසි - 2500
  - දෙමළ - 2500
- රුසියානු ජනාධිපති ව්ලැඩිමීර් පුටින් මැතිතුමා විසින් මෙරට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා වෙත සමරු තිළිණයක් ලෙස පිළිගන්වන ලද කස්තාන කඩුව ජාතික කෞතුකාගාරය වෙත භාරදීමේ උළෙල වෙනුවෙන් ආරාධනා පත්‍ර මුද්‍රණය කිරීම.

- අගමැතිතුමාගේ දේශපාලන දිවියට වසර 40 ක් පිරීම නිමිත්තෙන් මහරගම තරුණ සේවා පරිශ්‍රයේ පැවැත් වූ ප්‍රදර්ශනය සඳහා අඟල් 35 × 50 ප්‍රමාණයේ Crystal Light Board වර්ගයේ ප්‍රදර්ශන පුවරුවක් සැකසීම.

- ''ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කෘෂිකර්මය'' ග්‍රන්ථය නැවත මුද්‍රණයට බාරදීම

- ජාතික ස්වාභාවික විද්‍යා කෞතුකාගාරයේ මැදිරි නවීකරණයෙන් පසුව විවෘත කිරීමේ උත්සවය සඳහා ආරාධනා පත්‍රයක් මුද්‍රණය කිරීම

- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව මගින් ආයතනික පුහුණුව ලබාදෙන ශිෂ්‍ය - ශිෂ්‍යාවන් හට ලබාදෙනු ලබන සහතික පත් 200 ක් මුද්‍රණය කිරීම

- ජාතික ස්වාභාවික විද්‍යා කෞතුකාගාරයේ විද්‍යා හා තාක්ෂණ මැදිරි අත්පත්‍රිකාව භාෂාත්‍රයෙන් මුද්‍රණය කිරීම සඳහා මිල ගණන් කැඳවා අවශ්‍ය කටයුතු සිදුකිරීම

- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ විවිධ අංශ හා කෞතුකාගාර සඳහා වර්ණවත් ලිපිගොණු කවර මුද්‍රණය කිරීම සඳහා මිල ගණන් කැඳවා අවශ්‍ය කටයුතු සිදුකිරීම

### (ඇ). කෞතුකාගාර ජංගම බස්රථය

අධ්‍යාපන ප්‍රකාශන අංශය මගින් මේ වසරේ දී කෞතුකාගාර ජංගම බස්රථය ප්‍රදර්ශනය ස්ථාන 04 ක දී පවත්වන ලදී.

- ශාන්ත මරියා විද්‍යාලය - කෑගල්ල
- ශාන්ත තෝමස් විද්‍යාලය - බණ්ඩාරවෙල
- ජන කෞතුකාගාරය - අනුරාධපුර
- ශ්‍රී විජයනන්දනාරාමය - පිළියන්දල

### (ඈ). වෙනත් කටයුතු

- ජාතික කෞතුකාගාර පරිශ්‍රය තුළ පොලිතීන් හා නොදිරණ අපද්‍රව්‍ය දැමීමෙන් වළකින ලෙස කෞතුකාගාර නරඹන්නන් දැනුවත් කිරීම සඳහා කෞතුකාගාර පරිශ්‍රය තුළ දැන්වීම් පුවරු 05 ක් සවිකරවීම.

- කොළඹ ජාතික කෞතුකාගාරයේ, ජාතික ස්වාභාවික විද්‍යා කෞතුකාගාරයේ හා මහනුවර ජාතික කෞතුකාගාරයේ ප්‍රවේශපත්‍ර මිල සංශෝධනය පිළිබඳව පුවරු 03 ක් සවිකරවීම.

- සීමාවාසික පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා පැමිණි විශ්ව විද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අංශයේ කාර්ය භාරය පිළිබඳව පුහුණුව ලබාදීම.

## (8). ජාතික කෞතුකාගාර ශ්‍රවණාගාරය

ජාතික කෞතුකාගාර ශ්‍රවණාගාරය 2017 වසරේදී බාහිර ආයතන 21 ක් සඳහා කුලියට ලබා දෙන ලද අතර එයින් ලද ආදායම රු. 703,000.00 කි.

## (9). ජාතික කෞතුකාගාර පුස්තකාලය

### (අ). අත්කර ගැනීම්

- මෙම වසර තුළදී පුස්තකාලයට ලැබුණු විවිධ පුස්තකාල ද්‍රව්‍ය ලේඛනගත කළ සංඛ්‍යාව 14,148 කි.

### (ආ). පොත් බැඳීම්, සූක්ෂම සේයාපටල ගතකිරීම් හා ඡායා පිටපත්.

- පුස්තකාලය මගින් බඳින ලද පොත් සංඛ්‍යාව - 05
- ස්කෑන් කරන ලද පොත් සංඛ්‍යාව - 10
- ස්කෑන් කරන ලද පුස්කොළ පොත් සංඛ්‍යාව - 32
- පාඨකයන් සඳහා නිකුත් කළ ඡායාස්ථි පිටපත් ගණන- 7895

### (ඇ). පාඨක සංඛ්‍යාව

- ස්ථිර සාමාජිකත්වය ලබාගත් සංඛ්‍යාව - 12
- සාමාජිකත්වය අලුත් කරගත් සංඛ්‍යාව - 00
- තාවකාලික සාමාජිකත්වය ලබාගත් සංඛ්‍යාව - 30
- සාමාජිකත්වය තාවකාලික දීර්ඝ කරගත් සංඛ්‍යාව - 01
- මේ වසර තුළදී පුස්තකාලයට පැමිණි මුළු පාඨක සංඛ්‍යාව - 3344

### (ඈ). ආදායම

- මේ වසරේ පුස්තකාලයේ මුළු ආදායම - රු: 173,987.00

### (ඉ). අධ්‍යාපන කටයුතු

- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයින් 15 ක් සඳහා පුස්තකාලය පිළිබඳව අධ්‍යයනයක් ලබාදීම
- කැලණිය විශ්ව විද්‍යාලයේ බාහිර උපාධි ශිෂ්‍යයින් 50 ක් සඳහා පුස්තකාලය පිළිබඳව අධ්‍යයනයක් ලබාදීම

## (10). ඡායාරූප අංශය.

ඡායාරූප අංශය මගින් මේ වසරේදී දෙපාර්තමේන්තුවේ විවිධ අංශවලට අවශ්‍ය ඡායාරූප ගැනීම හා ලබාදීමත් හා අධ්‍යක්ෂතුමියගේ උපදෙස් පරිදි බාහිර ආයතනවලට හි පුද්ගලයින්ට අවශ්‍ය ඡායාරූප නිකුත් කිරීමත් සිදුකරන ලදී.

දෙපාර්තමේන්තුවේ අංශ හා කෞතුකාගාර සඳහා කරන ලද ඡායාරූපගත කිරීම් පහත දැක්වේ.

- **මානව වංශ විද්‍යා අංශය:**

1. බුදු පිළිම 418

2. බුදු පිළිමවල ඡායාරූප හා ඒවායේ ලියාපදිංචි අංක හා ඡායාරූප අංක සහිතව ලේඛනයක් මුද්‍රණය කිරීමට අවශ්‍ය මූලික පිටපත් සකස් කිරීම

3. කෞතුක භාණ්ඩ ලේඛන 12 ක් ඡායාරූපගත කිරීම. ඉන් ලේඛන 04 ක් මෘදු පිටපත් ලෙස සකස් කොට සංරක්ෂිත පිටපතක් ලෙස ගබඩා කර තැබීමට හා පරිගණක මඟින් පරිහරණය කිරීමට හැකිවන පරිදි PDF පිටපතක් ලෙස ලබාදීම.

- **කොළඹ ජාතික කෞතුකාගාරය:**

කොළඹ ජාතික කෞතුකාගාරයේ ප්‍රදර්ශිත කෞතුක භාණ්ඩ ඡායාරූපගත කර ඡායාරූප ලේඛනයක් සැකසීම. ඒ යටතේ ඡායාරූපගත කර ඇති මැදිරි පහත දැක්වේ.

1. ප්‍රාග් ඓතිහාසික මැදිරිය
2. අනුරාධපුර මැදිරිය
3. පොළොන්නරුව මැදිරිය
4. සංක්‍රාන්ති මැදිරිය
5. නුවර යුග මැදිරිය
6. සිතුවම් මැදිරිය
7. මිල මුදල් මැදිරිය
8. කලාශිල්ප මැදිරිය
9. අවි ආයුධ මැදිරිය
10. සාම්ප්‍රදායික කෘෂිකර්මය මැදිරිය

- **පරිගණක මුද්‍රිත ලේඛන සකසන ලද මැදිරි:**

1. ප්‍රාග් ඓතිහාසික මැදිරිය
2. අනුරාධපුර මැදිරිය
3. පොළොන්නරුව මැදිරිය
4. සංක්‍රාන්ති මැදිරිය
5. සිතුවම් මැදිරිය
6. මිල මුදල් මැදිරිය
7. කලාශිල්ප මැදිරිය
8. අවි ආයුධ මැදිරිය

- **මානව විද්‍යා අංශය:**

1. නැටුම් ඇඳුම් එකතුව ඡායාරූපගත කිරීම
2. තැළුම් උපකරණ ඡායාරූපගත කිරීම

- **සත්ත්ව විද්‍යා අංශය:**

1. කුරුළු ආදර්ශ එකතුවේ ආදර්ශක 100 ක් ඡායාරූපගත කිරීම

- **පුස්තකාලය:**

  ජාතික කෞතුකාගාර පුස්තකාලයේ පැරණි ලේඛන ඡායාරූපගත කිරීම

  1. පුස්කොළ පොත් 15

  2. දුර්ලභ පොත් 02

  පැරණි ලේඛන PDF පිටපත් ලෙස ලබාදීම

  1. ගැසට් පත්‍ර (1924 / 1925) 02

  2. පුස්කොළ පොත් 71

  3. දුර්ලභ පොත් 21

- **වෙනත්**

  1. කොළඹ, මහනුවර හා රත්නපුර කෞතුකාගාර සඳහා ප්‍රවේශපත්‍ර සකස් කිරීම

  2. ස්වාභාවික විද්‍යා කෞතුකාගාරය සඳහා අත්පත්‍රිකා 02 ක් නිර්මාණය කිරීම

වී අනුව ඡායාරූප අංශය මඟින් මේ වසරේදී කෞතුක භාණ්ඩ හා පුස්තකාල ලේඛන 16411 ක් ඡායාරූපගත කර සංයුක්ත තැටිගත කරන ලද අතර, දෙපාර්තමේන්තුවේ විවිධ අංශවලට ඡායාරූප 750 ක් නිකුත් කර ඇත. බාහිර පුද්ගලයින්ට හා ආයතනවලට කෞතුක භාණ්ඩවලට අදාල ඡායාරූප 253 ක් නිකුත් කර ඇත.

ඡායාරූප නිකුත් කිරීමෙන් දෙපාර්තමේන්තුවට ලැබුණු ආදායම රු: 19,990.00 කි.

## (11). සංරක්ෂණ අංශය

### (අ). 2017 වසරේ සංරක්ෂණය කරන ලද භාණ්ඩ

- <u>මානව වංශ විද්‍ය අංශයට අයත් භාණ්ඩ</u>

  1 VOC කාසි 2200 ක් සංරක්ෂණය කිරීම

  2 මුක්කරුන්ගේ ආයුධයක කොටස් 2 ක් සංරක්ෂණය කිරීම

  3 ලී මිට සහිත ගෑරුප්පුව සංරක්ෂණය කිරීම

  4 කුවේනි කපු කැටීමේ සිතුවම සංරක්ෂණය කර භාර දීම

- <u>මානව විද්‍ය අංශයට අයත් භාණ්ඩ</u>

  1. ට්‍රන්කා පෙට්ටි 01

  2. ලාහ 01

3. ඉබ්බා සමග යතුර 01

4. ගිරය

5. බලි රූප 06ක් සංරක්ෂණය කිරීම

- වැදි සන්නිය
- නීලගිරි යක්ෂණිය
- කළු කුමාරයා
- මහසෝනා
- කළුයක් බලිය
- රීරි යකා

6. වෙස්මුහුණු 11 ක් ධූමායනය කිරීම

7. ලී වංගෙඩියක් සංරක්ෂණය කිරීම

- **පුස්තකාලයට අයත් ග්‍රන්ථ**

**පොත් සංරක්ෂණය**

01. Ceylon Gazette 1924 part III (1500 pgs)
02.Ceylon Gazette 1925 part III (1460 pgs)
03.Dutch and Flemish furniture (336 pgs)
04. Scientific American Supplement Vol. XXX (406 pgs)
05. Sinhala pamphlets Buddhism
06. Sinhala English Dictionary
07.English Sinhala Dictionary
08.Ceylon Hansard (810 pgs)
09.The Ordinances of Ceylon 1942
10.Cloughs singh and Eng- Dictionary

- **ප්‍රාදේශිය කෞතුකාගාර වල සංරක්ෂණ කටයුතු**

**කොළඹ කෞතුකාගාරය**

1. ඇත් දළ පනා 35 ක් සංරක්ෂණය කර භාර දීම.

2. වෙන්කත රංගම්මාල් දේවියගේ රූපය සංරක්ෂණය කර රාමු කර භාර දීම.

3. උද්‍යානයේ තිබෙන ග්‍රෙගරි ප්‍රතිමාව යාන්ත්‍රික පිරිසිදු කිරීම.

4. තොලුවිල බුද්ධ ප්‍රතිමාව සහ පෙතිකඩ චිත්‍ර දෙකක කුඹල් ගෙවල් කඩා පිරිසිදු කිරීම.

**ඕලන්ද කෞතුකාගාරය**

ඕලන්ද ආණ්ඩුකාර නිල නිවසේ දී සිදුවූ ඕලන්ද නිලධාරීන් හා සිංහල නිලමේවරුන්ගේ හමුවීම දැක්වෙන චිත්‍රය සංරක්ෂණය කර භාරදීම.

**මහනුවර කෞතුකාගාරය**

1. කැප්පෙටිපොල කොඩිය

2. කිඳුරා කොඩිය

3. ගහෝනිය ( කත් වැසුම් 2 හා කත් ලී ආවරණය සමඟ )

4. කෞතුක භාණ්ඩ 300 කට අධික ප්‍රමාණයක්

**රත්නපුර කෞතුකාගාරය**

1. රෙදිපිළි 18

2. සිතියම් 13

**අනුරාධපුර කෞතුකාගාරය**

1. මැටි පාත්‍ර 01

2. විශාල ප්‍රමාණයේ මුට්ටි 01

## (ආ) ක්ෂේත්‍ර චාරිකා

- රත්නපුර කෞතුකාගාරයේ කෞතුක භාණ්ඩවල දැනට පවතින තත්ත්වය නිරීක්ෂණය කර කඩිනමින් සංරක්ෂණය කළයුතු කෞතුක භාණ්ඩ සංරක්ෂණ අංශය වෙත රැගෙන ඒම.

- ගාල්ල ජාතික කෞතුකාගාරයේ සංරක්ෂණය කිරීමට තිබූ කෞතුක භාණ්ඩ සියල්ල සංරක්ෂණය කර නිම කිරීම

## (ඇ). ශාක, කෘමි සහ සත්ත්ව මර්දන කටයුතු

- දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලිවල ආගන්තුක ශාක මර්දන කටයුතු සිදුකිරීම.

- භූ විද්‍යා මැදිරියේ මීයන් මර්දන කටයුතු සිදුකිරීම.

- උද්භිද විද්‍යා මැදිරියේ වේයන් මර්දන කටයුතු සිදුකිරීම.

- කොළඹ කෞතුකාගාරයේ කෘෂිකර්ම මැදිරියේ සහ වෙස්මුහුණු මැදිරියේ මීයන් මර්දන කටයුතු සිදුකිරීම.

### (ඈ). ආලෝකය හා ආර්ද්‍රතා වාර්තා ලබාගැනීම

1. කොළඹ කෞතුකාගාරයේ සිංහාසන මැදිරියේ ආලෝකය උෂ්ණත්වය හා ආර්ද්‍රතාවය පරීක්ෂා කර වාර්තා ලබාගැනීම.

2. මානව විද්‍යා අංශයේ ගබඩාවේ ආලෝකය උෂ්ණත්වය හා ආර්ද්‍රතාවය පරීක්ෂා කර වාර්තා ලබාගැනීම.

### (ඊ). බාහිර සේවා

1. ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවට අයත් වර්ණ ධජ 02 ක් සංරක්ෂණය කර භාරදීම.

2. ගාල්ල රිච්මන් විද්‍යාලයට අයත් නිලකබා 02ක් සංරක්ෂණය කර භාරදීම.

3. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් ගෙනෙන ලද වෙස්මුහුණු සංරක්ෂණය කර භාරදීම

4. මධ්‍යම සංස්කෘතික අරමුදලට අයත් කඹුරුපිටියේ වනරතන මහානාහිමියන් අනුස්මරණය කෞතුකාගාරයේ රෙදිපිළි එකතුවේ තත්ත්ව පරීක්ෂාවක් සිදුකිරීම

5. ටවර්හෝල් රඟහල පදනමට අයත් මීගමුව රුක්මණී දේවී කෞතුකාගාරයේ කෞතුක භාණ්ඩ එකතුව නිරීක්ෂණය කර වාර්තාවක් සැපයීම

### (උ). වෙනත් කටයුතු

- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අංශවල අවශ්‍යතා පරිදි පොත් 272 ක් බැඳීමේ කටයුතු සිදුකිරීම.
- පාලන අංශයට අවශ්‍ය පෞද්ගලික ලිපිගොණු කවර 55 සෑදීම

## (12). ප්‍රදර්ශන සැලසුම් අංශය

මෙම වර්ෂය තුළ ප්‍රදර්ශන සැලසුම් අංශය මඟින් අවසන් කරන ලද කාර්යයන් පහත පරිදි වේ.

- මහනුවර ජාතික කෞතුකාගාරයට ප්‍රදර්ශන මැදිරි නිර්මාණය කිරීම.
- අස්ථික මැදිරියේ ඉතිරි කොටසේ ප්‍රදර්ශන නිර්මාණ කටයුතු සිදු කිරීම.
- ජංගම ප්‍රදර්ශනවලට ගෙන යාම සඳහා ඇත් පහනේ ආකෘතිය අලුත් වැඩියා කිරීම.
- භූ විද්‍යා මැදිරියේ ප්‍රදර්ශන ආකෘති නිර්මාණය කිරීම.
- ගාල්ල ජාතික හා සමුද්‍ර කෞතුකාගාරවල ප්‍රදර්ශන මැදිරි සැලසුම් කිරීම හා අලුත් වැඩියා කිරීම.
- කස්තාන කඩුව ප්‍රදර්ශනය කිරීම සඳහා ප්‍රදර්ශන අල්මාරිය සකස් කිරීම.

## (13). තොරතුරු තාක්ෂණ අංශය.

මෙම වර්ෂය තුළ තොරතුරු තාක්ෂණ අංශය මඟින් සිදු කරන ලද කාර්යයන් පහත පරිදි වේ.

- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තු වෙබ් අඩවිය සඳහා නවතම පුවත්, කෞතුකාගාර චාරිකා, ශ්‍රවණාගාරය වෙන්කරවා ගැනීමේ ගාස්තු, කාර්යය මණ්ඩල තොරතුරු, නව ප්‍රවේශ පත්‍ර මිළ ආදිය අවශ්‍ය පරිදි යාවත්කාලීන කිරීම.

- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩල තොරතුරු ඇතුලත් දත්ත සංචිතයේ තනතුරු වලට බඳවා ගැනීම්, ස්ථාන මාරුවීම්, උසස්වීම් ආදිය යාවත් කාලීන කිරීම.

- ඉහත 2 දත්ත සංචිතයෙන් අවශ්‍ය අවස්ථාවන්හි දී තොරතුරු අදාල පාර්ශවයන්ට ලබාදීම.

- සත්ත්ව විද්‍යා අංශයේ පරිත්‍යාග වශයෙන් අත්පත් කරගත් ආදර්ශක 168 ක් වශයෙන් ස්වභාවික විද්‍යා අංශයේ ආදර්ශක 168 ක් (2017.01.01.NH සිට 2017.30.01.NH දක්වා) ස්වභාවික විද්‍යා මධ්‍යම අත්පත් කරගැනීමේ ලේඛනයේ ලියාපදිංචි කිරීම.

- මානව වංශ විද්‍යා අංශයේ පරිත්‍යාග වශයෙන් අත්පත් කරගත් කෞතුක භාණ්ඩ 25 ක් ද, මානව විද්‍යා අංශයේ පරිත්‍යාග වශයෙන් අත්පත් කරගත් කෞතුක භාණ්ඩ 02 ක් ද, මිලදී ගත් කෞතුක භාණ්ඩ 01 ක් ද, රත්නපුර ජාතික කෞතුකාගාරයේ පරිත්‍යාග වශයෙන් අත්පත් කරගත් කෞතුක භාණ්ඩ 03 ක් වශයෙන් කලා අංශයේ කෞතුක භාණ්ඩ 31 ක් (ලියාපදිංචි අංක 2017.1.1 සිට 2017.11.1 දක්වා) කලා අංශයේ මධ්‍යම අත්පත් කරගැනීමේ ලේඛනයේ ලියාපදිංචි කිරීම.

- ඉහත 4 හා 5 ට අදාල පරිත්‍යාග සඳහා සහතික පත්‍ර නිකුත් කිරීම.

- දෙපාර්තමේන්තු වාර්ෂික පරිගණක නඩත්තුව හා වෛරස් ආවරණ මෘදුකාංගය සම්බන්ධ කටයුතු කළමනාකරණය කිරීම.

- ලංකා රාජ්‍ය ජාල ව්‍යාපෘතිය 2 සංස්කරණයේ පලමු පියවර ලෙස ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සහ මුල්‍ය අංශ ගොඩනැගිල්ල සඳහා නිදහස් වයිෆයි ලබාදීමේ දී ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය හා උපකරණ සවිකිරීම සම්බන්ධව කටයුතු සිදුකළ පෞද්ගලික ආයතනය සමඟ සන්නිවේදන කටයුතු සිදුකර අදාල කාර්යය සම්පූර්ණ කිරීම.

### 2017 වර්ෂයේ කෞතුකාගාර දෙපාර්තමේන්තුවට අලුතින් එකතු වූ කෞතුක භාණ්ඩ

කලා අංශයට අයත් භාණ්ඩ 31 ක් ද, විද්‍යා අංශයට අයත් ආදර්ශක 168 ක් ද, වශයෙන් භාණ්ඩ 199 ක් මේ වසරේ ලියාපදිංචි කර ඇත.

| කලා අංශය | | විද්‍යා අංශය | |
|---|---|---|---|
| භාණ්ඩය | දිනය | භාණ්ඩය | දිනය |
| Collection of Flags (21) | 2017.01.01 To 2017.01/21 | Land snail Specimens (67) | 2017.01.01NH – 2017.01.67 NH |
| Gramophone (01) | 2017.02.01 | Schistura sp. - Holo type (01) | 2017.02.01NH |
| Kasthana Sword | 2017.03.01 | Schistura sp. - Holo type (02) | 2017.03.01NH – 2017.03.02NH |
| Weapon | 2017.04.01 | Fish Specimens (02) | 2017.04.01NH – 2017.04.02NH |
| Somana Cloth | 2017.05.01 | Frog Specimens (30) | 2017.05.01NH – 2017.12.06NH |
| Half Mandolin | 2017.06.01 | Skink Specimens (02) | 2017.13.01NH |
| පට කම්බාය | 2017.07.01 | Fossils (03) | 2017.14.01NH – 2017.16.01NH |
| Fork (01) | 2017.08.01 | Horn (01) | 2017.17.01NH |
| Hambbiliya | 2017.09.01 | Frog Specimens (06) | 2017.18.01NH – 2017.18.06NH |
| ශ්‍රී වික්‍රම රාජසිංහ රජු පරිහරණය කළ වස්ත්‍ර | 2017.10.01 | Aspidura Specimens (02) | 2017.19.01NH – 2017.20.01NM |
| Part of a female statue | 2017.11.01 | Devario Specimens (53) | 2017.21.01NH – 2017.30.01NH |

## (14). කෞතුකාගාරවල කටයුතු:

### (අ). කොළඹ ජාතික කෞතුකාගාරය.

කොළඹ ජාතික කෞතුකාගාරය මඟින් 2017/01/01 -2017/08/31 දක්වා වැඩ සටහන්, දේශන සහ සම්මන්ත්‍රණ කිහිපයක් පවත්වනු ලැබිණි.

සන්දර්ශක සේවා -

- අකුරැස්ස කලාප අධ්‍යාපන කාර්යාලයේ පාසල්වල ගුරු භවතුන් සිය දෙනෙක් වෙත කොළඹ ජාතික කෞතුකාගාරයේ වැදගත්කම පිළිබඳ දේශනයක් පැවැත්වීම සහ මාර්ගෝපදේශන සේවාව ලබා දීම - 2017.03.17
- Student Officers Of Defense Services Command And Staff College හි පුහුණු වන නිලධාරීන් 154 දෙනෙක් උදෙසා කොළඹ ජාතික කෞතුකාගාරයේ වැදගත්කම පිළිබඳ දේශනයක් පැවැත්වීම සහ මාර්ගෝපදේශන සේවාව ලබා දීම - 2017.03.20
- Sri Lanka China Society හි නියෝජිතයන් උදෙසා මාර්ගෝපදේශන සේවාව ලබා දීම - 2017.03.27
- ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලයේ සිසුන් 150 දෙනෙක් හට කොළඹ ජාතික කෞතුකාගාරයේ වැදගත්කම පිළිබඳ දේශනයක් පැවැත්වීම සහ මාර්ගෝපදේශන සේවාව ලබා දීම - 2017.05.26
- 19 වන ලෝක තරුණ හා ශිෂ්‍ය උළෙලට ( WFYS ) සමගාමීව මෙරට පැවති තුන්වන ජාත්‍යන්තර සුදානම් කිරීම් කමිටුවට පැමිණි විදේශීය නියෝජිතයන් උදෙසා මාර්ගෝපදේශන සේවාව ලබා දීම - 2017.05.27
- විශ්වවිද්‍යාල සිසුන් 60 ක් සඳහා කෞතුකාගාර ක්‍රමවේදයන් පිළිබඳ ප්‍රායෝගික වැඩමුළුවක් පැවැත්වීම - 2017.06.12 /2017.06.19 / 2017.06.28
- ගරු ජනාධිපතිතුමා විසින් කස්තාන අසිපතක් කෞතුකාගාරය වෙත පරිත්‍යාග කිරීම - 2017.08.02
- ඉන්දියානු නාවික හමුදා දූත පිරිස සඳහා මාර්ගෝපදේශන සේවාව ලබා දීම - 2017.08.02
- ඉන්දියානු යුධ හමුදා දූත පිරිස සඳහා මාර්ගෝපදේශන සේවාව ලබා දීම - 2017.08.03
- විදේශීය පුරාවිද්‍යාඥයින් උදෙසා මාර්ගෝපදේශන සේවාව ලබා දීම - 2017.08.05
- ඉන්දියානු යුධ හමුදාපති දූත පිරිසේ සංචාරය - 2017.08.17
- සිංගප්පූරු දූත පිරිසේ සංචාරය - 2017.08.31

කොළඹ ජාතික කෞතුකාගාරය මඟින් දැනට ප්‍රදර්ශිත කෞතුක වස්තු පිළිබඳ සමීක්ෂණ කටයුතු කිහිපයක් සිදු කරමින් පවතී.ඒ අනුව ප්‍රාග් ඓතිහාසික මැදිරියේ සිට මහනුවර යුග මැදිරිය දක්වා කෞතුක භාණ්ඩ සමීක්ෂණ කටයුතු වල 60% ක් ද ඇන්ඩෲ නිකොල් රෙදිපිළි සෙරමික් මැදිරියේ කෞතුක භාණ්ඩ සමීක්ෂණ කටයුතු වලින් 95% ක් ද මිල මුදල් මැදිරියේ කෞතුක භාණ්ඩ සමීක්ෂණ කටයුතු වලින් 90% ක් ද කලා ශිල්ප , අවි ආයුධ, ධජ පතාක මැදිරිවල කෞතුක භාණ්ඩ සමීක්ෂණ කටයුතු වලින් 40% ක් ද දත්ත වාර්තා කර ඇති අතර ඒ සියල්ල පරිගණක ගත කරමින් පවතී.එමෙන්ම ශෛලමය පුරා වස්තු මැදිරියේ සහ සිතුවම් ප්‍රදර්ශන මැදිරිවල කෞතුක භාණ්ඩ සමීක්ෂණ කටයුතු වලින් 80% ක් පමණ දත්ත වාර්තා කර ඇති අතර ඒ සියල්ල පරිගණක ගත කර ඇත. බාහිර පාර්ශවයන්ට තොරතුරු ලබා දීමේ දී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කෞතුකාගාර විද්‍යාව හදාරන සිසුන්ට තොරතුරු ලබා දීම.

## (ආ). ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරය.

ස්වභාවික විද්‍යා කෞතුකාගාර කාර්යාලය වායු සමීකරණය කිරීම සඳහා අවශ්‍ය ලංසුපත් විවෘත කර උපදේශක වාර්තාවක් ලබා ගැනීම සඳහා CECB ආයතනයට ඉදිරිපත් කර ඇත. 2017.04.04 වන දින රාගම ප්‍රාථමික විද්‍යාලයේ සිසුන් 100 ක් සඳහා ද, 2017.05.22 මීරිගම ඩී.එස්.සේනානායක විද්‍යාලයේ හය වසර සිසුන් 170 ක් සඳහා ද, 2017 මැයි මස නුගේගොඩ ලයිසියම් ජාත්‍යන්තර පාසලේ පහ වසර සිසුන් 190 ක් සඳහා ද කෞතුකාගාරය පිළිබඳ සංදර්ශන සේවා පවත්වා ඇත. එමෙන්ම ගම්පහ පෞද්ගලික විද්‍යායතනයක සිසුන් සඳහා ද දේශනයක් පැවැත්වීම සිදු කර ඇත. මේවාට අමතරව බාහිර පාර්ශවයන් හා ආයතන සමඟ සමගාමීව සිදු කළ විශේෂ කාර්යයන් පහත දැක්වේ.

- 2017.02.18 නුගේගොඩ මහාමයා බාලිකා විද්‍යාලීය සිසුන් 200 ක් සඳහා ශාක විවිධත්වය හා සත්ත්ව විවිධත්වය වෙනුවෙන් දේශන මාලාවක් පැවැත්වීම.

- 2017.04.04 වන දින කොළඹ බෞද්ධ කාන්තා විද්‍යාලීය හය වසර සිසුන් සඳහා විද්‍යා විෂය නිර්දේශයට කෞතුකාගාරයෙන් යන මැයෙන් වැඩ මුළුවක් පැවැත්වීම.නුගේගොඩ සමුද්‍රදේවී බාලිකා විද්‍යාලයේ සිසුන් සඳහා විෂය නිර්දේශයට අත් වැලක් යන මැයෙන් දේශන මාලාවක් පැවැත්වීම.

- 2017.05.03 වන දින සිට 2017.05.31 වන දින දක්වා පැවති ආයතනික පුහුණු වැඩ සටහනේ දී ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ කාර්යභාරය පිළිබඳව 2017.05.31 වන දින දැනුවත් කිරීමේ දේශනයක් පැවැත්වීම.

- ශ්‍රී ලංකා ජාතික වන ජීවී පර්යේෂණ හා පුහුණු කේන්ද්‍රය පාලක තනතුරෙහි නියුතු පුහුණු වන නිලධාරීන් සඳහා 2017.07.03 වන දින වැඩමුළුවක් පැවැත්වීම.

- 2017.08.08 වන දින බිෂොප් විද්‍යාලයේ සිසුන් සඳහා පාරිසරික ක්‍රියාකාරකම් වැඩමුළුවක් පැවැත්වීම.

- 2017.08.08 වන දින ශ්‍රී ලංකා ජාතික වන ජීවී පර්යේෂණ හා පුහුණු කේන්ද්‍රය නිලධාරීන් සඳහා වැඩමුළුවක් පැවැත්වීම.

- 2017.08.21 වන දින ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයීය පළමු වසර ජීව විද්‍යා සිසුන් සඳහා අස්ථි සැකිලි පිළිබඳ දේශනයක් පැවැත්වීම.

- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සත්ත්ව විද්‍යා අංශයේ අවසන් වසර සිසුන් 30 ක් සඳහා කෞතුකාගාර කළමණාකරණය, ආරක්ෂාව, ප්‍රදර්ශන සැලසුම් කිරීම පිළිබඳව 2017.09.01 දින සිට සතියක වැඩමුළුවක් පැවැත්වීම.

- 2017.11.17 දින ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ මාර්ගෝපදේශකයින් 35 දෙනෙක් සඳහා ස්වාභාවික විද්‍යා කෞතුකාගාරය හා එහි කාර්යභාරය ද, සංචාරක ව්‍යාපාරය ඔස්සේ ජාතික ස්වාභාවික විද්‍යා කෞතුකාගාරයෙන් ඉටුවන කාර්ය භාරයන් වන ස්වාභාවික උරුමයන් සුරැකීම හා ඒ සඳහා විදේශිකයින් දැනුවත් කරන්නේ කෙසේද යන්න පිළිබඳ වැමුළුවක් පැවැත්වීම.

- 2017.11.14 දින ශ්‍රී ලංකා ජාතික වනජීවී පර්යේෂණ හා පුහුණු කේන්ද්‍රය නිලධාරීන් සඳහා ශ්‍රී ලංකාවේ ස්වාභාවික උරුමය සුරැකීම සඳහා ජාතික ස්වාභාවික විද්‍යා කෞතුකාගාරය දායක වී ඇති ආකාරය හා ඒ සඳහා ශ්‍රී ලංකා වනජීවී දෙපාර්තමේන්තුවේ සහයෝගය ලබාගන්නේ කෙසේද යන්න පිළිබඳව වැඩමුළුවක් පැවැත්වීම.

- 2017.12.07 දින ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ මාර්ගෝපදේශකයින් 35 දෙනෙක් සඳහා ස්වාභාවික විද්‍යා කෞතුකාගාරය හා එහි කාර්යභාරය ද, සංචාරක ව්‍යාපාරය ඔස්සේ ජාතික ස්වාභාවික විද්‍යා කෞතුකාගාරයෙන් ඉටුවන කාර්ය භාරයන් වන ස්වාභාවික උරුමයන් සුරැකීම හා ඒ සඳහා විදේශිකයින් දැනුවත් කරන්නේ කෙසේද යන්න පිළිබඳ වැඩමුළුවක් පැවැත්වීම.

මීට අමතරව ජාතික ඉංජිනේරු තාක්ෂණ උරුම මැදිරිය සඳහා භාෂා ත්‍රිත්වයෙන්ම අත් පත්‍රිකාවක් මුද්‍රණය සඳහා සකස් කරන ලදි. එමෙන්ම පොලිෂර් යන්ත්‍රයක්, හුවර් යන්ත්‍රයක් හා අත් හුවර් යන්ත්‍ර 02 ක් කෞතුකාගාරයට ලබා ගන්නා ලදි. එසේම අස්ථි විද්‍යා මැදිරියේ ප්‍රදර්ශිත ආදර්ශක වටා ආරක්ෂක වැටක් ඉදිකරවන ලදී.

## (ඇ). මහනුවර ජාතික කෞතුකාගාරය.

සංරක්ෂණ අලුත්වැඩියා කටයුතු හා ප්‍රදර්ශන නවීකරණ කටයුතු සඳහා 2017.09.15 වන දින සිට වසා තිබූ මහනුවර ජාතික කෞතුකාගාරය 2017.04.04 දින නැවත මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත කරන ලදි.

**මහනුවර ජාතික කෞතුකාගාරයේ සංරක්ෂණ ව්‍යාපෘතිය**

- **දිරාපත් වී තිබූ වහලය අලුත්වැඩියා කිරීම**

  මෙහි දී දිරාපත් වී දැඩි ලෙස හායනයට තිබූ මහා පරිමාණයේ දැවමය බාල්ක, යටලී, රීප්ප, ලතා ලෑලි ප්‍රවේශමෙන් ඉවත් කර ඒ වෙනුවට සුදුසු පරිදි කොස් දැවය ආදේශ කර ගොඩනැඟිල්ලේ වහලය සංරක්ෂණය කිරීම ඉතා වැදගත් වේ.

- **ගොඩනැඟිල්ල ඇතුළත බිමෙහි අතුරා තිබූ සිමෙන්ති ඉවත් කිරීම.**

  විද්‍යාත්මක ක්‍රමවේදයන්ට අනුව කැණීම් කර පොළොව මතුපිට සිට එහි පුරාවිද්‍යා දත්තයන් තහවුරු වන තුරු පොළොව අභ්‍යන්තරය කැණීමට ලක් කිරීම.

- **බිත්ති සංරක්ෂණය කිරීම**

  මේ යටතේ හුණු පිරියම් කරන ලද බිත්ති හොඳින් අධ්‍යයනය කර දැඩි ලෙස බොල් වී පැවති කොටස් පළමුව කඩා ඉවත් කිරීම.

  පාසි බැඳී පැවති බිත්ති දැඩි ලෙස දුර්වර්ණ ව පැවති අතර ඒවා කඩා ඉවත් කර මව් බිත්තියට හානියක් නොවන පරිදි යථාතත්වයට පත් කිරීම.

- **ලාක්ෂා අලංකරණයෙන් යුතු බීරළු ජනේල (Lack Work) සංරක්ෂණය කිරීම**

  ලාක්ෂා අලංකරණයෙන් හෙබි බීරළු සුළං කවුළු සංරක්ෂණය කිරීම. මෙවැනි ලාක්ෂා කැටයමින් අනූන බීරළු ජනේල 16 ක් කෞතුකාගාරයේ ඓතිහාසික වශයෙන් ස්ථාපිත කර ඇති අතර, ඒවා දුර්වර්ණ වී හායනයට ලක් වෙමින් පැවතිනි. පසුව ඒවා හොඳින් හඳුනා ගෙන බීරළු සහිත වා කවුළු සංරක්ෂණය කිරීමේ ක්‍රියාවලිය.

- **නුවර යුගයේ සම්ප්‍රදාය පිළිබිඹු කෙරෙන දොරපියන් 06 ක් සංරක්ෂණය කිරීම**
- **පෞරාණික අඟුල් සංරක්ෂණය**
- **ගොඩනැඟිල්ලේ බිම සංරක්ෂණය කිරීම**
- **වටපිළ (Out Door) ප්‍රතිසංස්කරණය කිරීම**
- **කෞතුකාගාර ප්‍රදර්ශනය ප්‍රතිනිර්මාණය කිරීම**

## (ඈ). ඕලන්ද කෞතුකාගාරය

පාසල් ළමුන් , විශ්ව විද්‍යාල සිසුන්, විදේශීය හා දේශීය නරඹන්නන් සඳහා සංදර්ශන සේවා ඕලන්ද කෞතුකාගාරය මඟින් ඉටු කිරීම. බාහිර පාර්ශවයන්ට තොරතුරු ලබා දීමේ දී , සංචාරක මාර්ගෝපදේශකයන් සඳහා සංචාරක ආයතන වලට තොරතුරු ලබා දීම,සංචාරකයන් නවාතැන් ගන්නා හෝටල්වල නිලධාරීන් හා සේවකයන් ,පාසල් සිසුන් සඳහා තොරතුරු ලබා දීමේ හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සිදුකර ඇත.එමෙන්ම ඕලන්ද කෞතුකාගාරය මඟින් කොළඹ මහ නගර සභාව හා පොලිස් පරිසර ඒකකය යන බාහිර පාර්ශවයන් සහ ආයතන සමඟ කෞතුකාගාරය අවට පිරිසිදු කිරීම හා මදුරු මර්දන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබිණි.

## (ඉ). රත්නපුර ජාතික කෞතුකාගාරය.

පාසල් ළමුන් , විශ්ව විද්‍යාල සිසුන්, විදේශීය හා දේශීය නරඹන්නන් සඳහා සංදර්ශන සේවා ඉටු කිරීම, බාහිර පාර්ශවයන්ට තොරතුරු ලබා දීම රත්නපුර කෞතුකාගාරය මඟින් ඉටු කරන ලදී.රත්නපුර ජාතික කෞතුකාගාරයේ අළුතින් ප්‍රදර්ශනය සඳහා සෝමනය, දාර 16 කින් යුත් අලි හක්කක්, මුවෙකුගේ හෝ ගෝනෙකුගේ අඟක්, රයිනෝසිරස් දතක් සහ රයිනෝසිරස් හක්කක් යන කෞතුක භාණ්ඩ හා ආදර්ශක ලේඛන ගත කරන ලදී.

එසේම කෞතුකාගාර සංස්කෘතික ගොඩනැගිල්ලේ සියළු වැඩ නිම කර ප්‍රවේශපත්‍ර අලෙවිය සඳහා යොදා ගැනමත්, කෞතුකාගාර පිටගෙය නමින් හඳුන්වන කොටසෙහි අළුත්වැඩියා කටයුතු නිම කිරීමත් සිදු කරන ලදී..

## (ඊ). අනුරාධපුර ජන කෞතුකාගාරය.

2017 පොසොන් සතිය වෙනුවෙන් අත්තිකාරමක් ලබා ගෙන තෝරා ගත් කොටසක් තීන්ත ආලේප කරන ලදි.ජංගම බස් රථය පොසොන් සතියේ ප්‍රදර්ශනය කිරීම කර ඇත.දේශීය සහ විදේශීය නරඹන්නන් සඳහා වරින් වර දේශනා පැවැත්වීම සිදු කර ඇත.බාහිර පාර්ශවයන් සහ ආයතන සමඟ සිදු කළ විශේෂ කාර්යයන් වශයෙන් පස් දමා උද්‍යානය සකස් කිරීම - මධ්‍යම සංස්කෘතික අරමුදලේ අනුරාධපුර කාර්යාලයෙන් ලබා දීම, පුරා විද්‍යාත්මක වටිනාකමක් ඇති කළු ගල් එක තැනකට ගොඩ ගැසීම - පුරා විද්‍යා කාර්යාලය අනුරාධපුරය, මධ්‍යම සංස්කෘතික අරමුදලේ අනුරාධපුර කාර්යාලයට අයත් ලෝඩරය මඟින් උද්‍යානයේ හුඹස් ආදිය ඉවත් කර දීම,නගර සභාව මඟින් නව කසල බඳුන් ලබා දීම, රාජ්‍ය දැව සංස්ථාව විසින් අවධානම්ව පැවති බුරුත ගසේ අත්තක් කපා ඉවත් කර දීම, ජනාධිපති මැදුර දෙසට ඇති වැට දෙපාර්ශවයේ ශ්‍රමයෙන් සකස් කර දීම.

## (උ). ගාල්ල ජාතික කෞතුකාගාරය.

කස්තාන නිල ඇඳුම (ලියාපදිංචි අංක - 2016.32.1 ) යන කෞතුක භාණ්ඩ ආදර්ශකය අලුතින් ප්‍රදර්ශනය සඳහා ලේඛන ගත කර ඇත. කෞතුකාගාරය නවීකරණය කිරීමේ දී 2017.06.22 දිනෙන් ඇරඹී අළුත් වැඩියා කටයුතු 2017.09.06 දිනෙන් අවසන් කිරීමත්, 2017.08.16 දින සිට 2017.08.18 දක්වා ප්‍රදර්ශන ව්‍යුහය ප්‍රතිසංවිධානය කිරීමත්, 2017.09.06 සිට 2017.09.08 දක්වා සංරක්ෂණ කටයුතු පළමු අදියර නිම කිරීමත් සිදු කර ඇත. සංදර්ශක සේවා ලබා දීමේ විශේෂ අවස්ථාවක් ලෙස 2017.01.14 දින ගාල්ල ලබුදූව, සිරිධම්ම විද්‍යාලයේ පැවති " ජනපති නිල මෙහෙවර " වැඩ සටහන සඳහා ගාල්ල ජාතික කෞතුකාගාරය නියෝජනය කිරීම සහ කෞතුකාගාර ප්‍රකාශන අලෙවි කටයුතුත් සිදු කරන ලදී. එමෙන්ම පාසල් ළමයින්ගේ හා විශ්ව විද්‍යාල සිසුන්ගේ කේවල ව්‍යාපෘති, ව්‍යාපෘති සඳහා තොරතුරු ලබා දීම, දැනුවත් කිරීම සහ මඟ පෙන්වීමට ද කටයුතු කර ඇත. ගාලු උරුමය, ගාල්ල පුරා විද්‍යා කාර්යාලය, නාගරික සංවර්ධන අධිකාරිය සහ ගාලු නගර සභාව සමඟ ලෝක උරුම ගාලු කොටුවේ සංවර්ධන හා සංරක්ෂණ කටයුතු වෙනුවෙන් සහභාගී විය.

## (ඌ). ගාල්ල සමුද්‍ර කෞතුකාගාරය

ගාල්ල සමුද්‍ර කෞතුකාගාරය නවීකරණය කිරීමේ දී ධීවර අනුරූවල දුර්වර්ණ වූ ඇඳුම් පිරිසිදු කිරීම හා නැවත යෙදීම, දිරාපත් වූ ඇඳුම් සඳහා අලුත් ඇඳුම් යෙදීම සිදුකර ඇත. එමෙන්ම අක්‍රිය වූ විදුලි බුබුළු ඉවත් කොට නව LED විදුලි පහන් සවි කිරීම ද සිදු කර ඇත. 2017.01.14 දින ගාල්ල ලබුදූව, සිරිධම්ම විද්‍යාලයේ "ජනපති නිලමෙහෙවර" වැඩ සටහන සඳහා සමුද්‍ර කෞතුකාගාරය මඟින් ප්‍රදර්ශන පුවරු සහ ප්‍රකාශන අලෙවි කටයුතු සිදුකරන ලදී. පාසල් ළමයින්ගේ කේවල ව්‍යාපෘති හා විශ්ව විද්‍යාල සිසුන්ගේ ව්‍යාපෘති සඳහා තොරතුරු ලබාදීම, ගාලු උරුමය, ගාල්ල පුරාවිද්‍යා කාර්යාලය, නාගරික සංවර්ධන අධිකාරිය සහ ගාලු නගර සභාව සමඟ ගාලු කොටුවේ සංවර්ධන කටයුතු සහ එහි සංරක්ෂණ කටයුතු වෙනුවෙන් සමුද්‍ර කෞතුකාගාරය සහභාගි වී ඇත

## (එ). නිදහස් අනුස්මරණ කෞතුකාගාරය.

නිදහස් අනුස්මරණ කෞතුකාගාරය මඟින් මේ වසරේදී කෞතුකාගාරය නැරඹීමට පැමිණෙන පාසැල් කණ්ඩායම් හා නරඹන්නන් වෙනුවෙන් සංදර්ශන සේවය ලබා දෙන ලදී. එසේම ජපන් ජාතික ශිෂ්‍යයන් 04 දෙනෙකුට සහ ගුරුවරයෙක් සඳහා ද, ශ්‍රී ලංකා වාණිජ කර්මාන්ත මණ්ඩල සම්මේලනයට පැමිණ විදේශිකයන් 16 දෙනෙකු සඳහා ද, කැළණිය විශ්ව විද්‍යාලයේ සිසුන් 28 දෙනෙකු සඳහා ද ආයතනික කාර්යයභාර්යය පිළිබඳව දැනුම ලබා දීම සිදු කරන ලදී.

එසේම ජාතික රූපවාහිනිය මඟින් ප්‍රචාරය කරන "වාසුලිය" වැඩසටහනට නිදහස් අනුස්මරණ කෞතුකාගාරය රූගත කරන ලදී.

මීට අමතරව කෞතුකාගාරය තුළට පිරිසිදු වාතාශ්‍රය නවීන Inlet Fan උපකරණ සවි කිරීමත්, නව ග්‍රිල් ගේට්ටු (යකඩ) 2 ක් සවි කිරීමත් සිදු කරන ලදී.

## (ඒ). මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය.

කෞතුකාගාර අවශ්‍යතා සඳහා නව ගොඩනැගිල්ලක් ඉදි කරමින් පවතී. පොට් ඇදීම , ජල , විදුල පද්ධති සවි කරමින් පවති. එමෙන්ම පාසල් කණ්ඩායම්වල විශේෂ ඉල්ලීම් , විදේශිය කණ්ඩායම්වල විශේෂ ඉල්ලීම් , පර්යේෂකයින්ගේ විශේෂ ඉල්ලීම් හා විශේෂ අමුත්තන් සඳහා කෞතුකාගාරය පිළිබඳව තොරතුරු ලබා දීම සිදු කර ඇත.

## (15). 2017 වසරේ ආදායම

| කෞතුකාගාරයේ නම | ප්‍රවේශපත්‍ර | ප්‍රකාශන | කැමරා බලපත්‍ර | පුස්තකාලය | ශ්‍රවණාගාරය | වාහන ප්‍රවේශපත් | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| කොළඹ ජාතික කෞතුකාගාරය | 50,008,250 | 1,002,054 | 1,151,250 | 180,743 | 703,000 | 64,880 | 680,662 | 53,771,839 |
| ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරය | 5,764,490 | 41,275 | 34,500 | - | - | 255,725 | - | 6,095,990 |
| ඕලන්ද කෞතුකාගාරය | 833,100 | 441 | 40,250 | - | - | - | - | 873,791 |
| මහනුවර ජාතික කෞතුකාගාරය | 1,358,635 | 30,046 | 25,500 | - | - | - | - | 1,414,181 |
| ගාල්ල ජාතික කෞතුකාගාරය | - | 692 | - | - | - | - | - | 692 |
| රත්නපුර ජාතික කෞතුකාගාරය | 239,360 | 99,391 | 18,250 | - | - | - | - | 357,001 |
| ගාල්ල සමුද්‍ර කෞතුකාගාරය | 1,288,265 | 10,700 | 39,250 | - | - | - | - | 1,338,215 |
| අනුරාධපුර ජන කෞතුකාගාරය | 173,220 | 90,332 | 750 | - | - | - | - | 264,302 |
| නිදහස් අනුස්මරණ කෞතුකාගාරය | 375,210 | 10,000 | 17,250 | - | - | - | - | 402,460 |
| මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය | 41,415 | 12,470 | - | - | - | - | - | 53,885 |
| **එකතුව** | **60,081,945** | **1,303,629** | **132,700** | **180,743** | **70,300** | **320,605** | **680,662** | **64,578,584** |

- සංරක්ෂණමය අලුත්වැඩියා කටයුතු සඳහා ගාල්ල ජාතිත කෞතුකාගාරය තාවකාලිකව වසා ඇත.

- **2017 වසරේ ආදායම, 2016 වසරේ ආදායම සමග සංසන්දනය කිරීම.**

2017 වර්ෂයේ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ මුළු ආදායම රු. 64,578,584 ක් වන අතර, 2016 වර්ෂයේ සමස්ත ආදායම රු. 43,696,259 ක් විය. ඒ අනුව 2016 වර්ෂයට වඩා 2017 වර්ෂයේ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ආදායම 20,882,325 කින් වැඩි වී ඇත.




- ප්‍රස්ථාර අංක 01: ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ආදායම




- ප්‍රස්ථාර අංක 02: ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ නරඹන්නන් සංඛ්‍යාව

සනුජා කස්තුරිආරච්චි

ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ (වැ.බ.)

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

කොළඹ 07

සංරක්ෂණාමය අලුත්වැඩියා කටයුතු වලින් පසුව කොළඹ ජාතික කෞතුකාගාරය
මහජනතාව සඳහා නැවත විවෘත කිරීම. (2017.02.06)












සංරක්ෂණමය අලුත්වැඩියා කටයුතු වලින් පසුව මහනුවර ජාතික කෞතුකාගාරය
මහජනතාව සඳහා නැවත විවෘත කිරීම. (2017.04.04)





ජාත්‍යන්තර කෞතුකාගාර දින සැමරුම (රත්නපුර ජාතික කෞතුකාගාරයේදී)








ශ්‍රී ලංකා ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා වෙත රුසියානු සමූහාණ්ඩුවේ
ජනාධිපති ව්ලැඩිමීර් පුටින් මහතා විසින් ත්‍යාගයක් ලෙස පිරිනමන ලද කස්තාන කඩුව
කොළඹ ජාතික කෞතුකාගාරය වෙත බාර දීම (2017.08.02)









ජාතික ස්වාභාවික විද්‍යා කෞතුකාගාරයේ අස්ථික විද්‍යා මැදිරිය, භූ විද්‍යා මැදිරිය හා උද්භිද විද්‍යා මැදිරිය මහජනතාව සඳහා විවෘත කිරීමේ උත්සවය (2017.10.09)





"Gone With the Wind and Waves Maritime silk Road Chinese Cultural Relics Exhibition"
(කොළඹ ජාතික කෞතුකාගාරය)







ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය - ශිෂ්‍යාවන් වෙනුවෙන් පවත්වන ලද
ආයතනික පුහුණු වැඩසටහන





2017.11.06 සිට 2017.11.14 දක්වා පැවති කෞතුක භාණ්ඩ සංරක්ෂණය පිළිබඳ වැඩමුළුව






NATIONAL MUSEUM

COLOMBO

53, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව

දුරකථන - ප්‍රධාන කාර්යාලය - 011-2694767, ෆැක්ස් - 011-2692092

ඊමේල් - nmdep@slt.gov.lk, වෙබ් - www.museum.gov.lk

53, சேர் மார்க்கஸ் மாவத்தை, கொழும்பு 07, இலங்கை

தொலைபேசி இலக்கம் - பிரதான அலுவலகம் 011-2694767

பெக்ஸ் - nmdep@slt.gov.lk, மின்னஞ்சல் இணையம் - www.museum.gov.lk

53, Sri Marcus Fernando Mawatha, Colombo 07, Sri Lanka

Tele - Genaral Office - 011-2694767, Fax - 011-2692092

E-mail - nmdep@slt.lk, Web - www.museum.gov.lk